# The SIGNALL

19

SRI LANKA SIGNAL CORPS JOURNAL - 2017



"Salute to all dedicated and unswerving officers and men for keeping the Signals Flag soaring at the best"

## සංඥා බලකා ගීතය

මව්බිම දිනවන ජයටැඹ වෙත යන
ස්ථිර සෘණික ගුණ නැණ බල පිරී
අපි ශ්‍රී ලංකා සංඥා බලකායයි ........ //

නව විදු ලොව නැගි දියුණුව
ගෙන එඩියෙන් මව්බිම සරසමු
නිමැවුම් නව දැන නිසැකව
විදු එළියෙන් හෙට ලොව දිනනෙමු

රැපු සෙන් බලමුළු සිඳබිඳ
විද්‍යුත් සංග්‍රාමික තෙද
අපි දිරි දෙමු රණබිම් වැද
සිත් පැසසුම් සතොසින් විඳ

මව්බිම දිනවන ජයටැඹ වෙත යන
ස්ථිර සෘණික ගුණ නැණ බල පිරී
අපි ශ්‍රී ලංකා සංඥා බලකායයි ........ //

සංඥා සිප් සෙත නංවන
ශිල්ප සදන තොරතුරු තාක්ෂණ
නිති සළසමු පොදු ජන සෙත
නංවමු ලක්මව ලොව දස අත

සයුර ගුවන බිම රජයන
සුමිතුරු බලමුළු යා කොට
නිසි මග ගෙන යන අප බලකායට
නිති පතනෙමු කිත් පැසසුම් ජය ........

මව්බිම දිනවන ජයටැඹ වෙත යන
ස්ථිර සෘණික ගුණ නැණ බල පිරී
අපි ශ්‍රී ලංකා සංඥා බලකායයි ........ //

පද රචනය :- ලුතිතන් කර්නල් ඩබ්ඩීඑස්එන් ප්‍රනාන්දු
සංගීතය :- විශාරද ජගත් වික්‍රමසිංහ මහතා

The SIGNALLER

## කතුවැකිය

74 වන සංවත්සරය සමරන ශ්‍රී ලංකා සංඥා බළකායෙහි වාර්ෂිකව එළිදක්වනු ලබන "ද සිග්නලර්" සඟරාවෙහි 19 වන කලාපය සඳහා ප්‍රධාන සංස්කාරක වශයෙන් කටයුතු කිරීමට ලැබීම මා හට මහත් ගෞරවයකි.

"ද සිග්නලර්" සඟරාව බාහිර ලෝකය හමුවේ සංඥා බළකායෙහි ප්‍රතිරූපය ගොඩනංවන සාධක අතරින් ආකර්ශනීය අංගයක් බවට අද වන විට පත්ව තිබේ. මෙමගින් සංඥා බළකා සාමාජිකයින්ගේ නිර්මාණශීලිත්වය පිළිබිඹු වන අතරම බළකායේ කාලීන සිදුවීම් හුවා දක්වමින් බළකා ඉතිහාසය ලේඛන ගත කිරීමෙහිත් ඉතිහාසගත තොරතුරු නිරාවරණය කර ගැනීමෙහිත් අනලස් මෙන්ම අද්විතීය ප්‍රයත්නයක මහගු ඵලයක් ඇති කරයි.

හුදෙක්ම සාමාන්‍ය තොරතුරු ගෙන එන පොදු සඟරාවක් නොවන "ද සිග්නලර්", තාක්ෂණයෙන් පිරිපුන් වෘත්තිය හමුදාවක සන්නිවේදන ක්‍රියාදාමයේ එකම සහ ප්‍රමුඛයා වන සංඥා බළකායෙහි වෘත්තිය හා සමාජයීය ක්‍රියාදාමයන්හි කැඩපතද වේ. එබැවින් මෙහි උපරිම ඵල නෙලා ගැනීම සඳහා සංඥා බළකායේ සියලුම සාමාජිකයන් හට උපරිමයෙන් අවස්ථාව ඇති අතර, ඉන් ඵලදායි ලෙසින් ප්‍රයෝජනය ගැනීම උදෙසා තමන් සතු විශේෂිත දැනුම බෙදාහදා ගැනීමටත් නව නිර්මාණ එළිදැක්වීමටත් තම ආයතන, ඒකක, මූලස්ථානයන්හි අභිමානය විදහා දැක්වීමටත් මෙම සඟරාවෙහි ඇති ඉඩ තෝතැන්නක් කරගත යුතුය.

අවසාන වශයෙන් මෙවර කලාපය හරවත් අයුරින් සකස්කොට මුද්‍රණය කිරීමට කැපවී ක්‍රියා කළ සංස්කාරක මණ්ඩලයේ සියලුම සාමාජිකයින් හට ප්‍රධාන සංස්කාරක වශයෙන් ප්‍රසංශාව පුදකර සිටිමි.

### ප්‍රධාන සංස්කාරක

කර්නල් කේ ඒ ඩබ් එස් රත්නායක
ලුතිතන් කර්නල් එන් පි ඒ මෙන්ඩිස් පීඑස්සී ශ්‍රීලංසංබ
මේජර් ඩබ් ඒ ජ එස් කරුණාරත්න ශ්‍රීලංසංබ
මේජර් ඒ එම් සී කේ ගුණතිලක ශ්‍රීලංසංබ

### සෝදුපත් කියවීම

කපිතන් ඩීවීඑන් ධර්මප්‍රිය ශ්‍රීලංසංබ

### ග්‍රැෆික් නිර්මාණය

ලා/කෝ පිරිස් එස් ආර් ඒ එම්

### මුද්‍රණය

AMP ප්‍රින්ටින් පුද්ගලික ආයතනය,
නො 54, නුවරඑළිය පාර, ගම්පොළ.
දුරකථන : 077 787 5165
081 235 0345

### ලිපිනය

රෙජිමේන්තු මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා සංඥා බලකාය,
යුද හමුදා කඳවුර,
පනාගොඩ,
හෝමාගම.
දුරකථන :+94112855361
ඊමේල් : rhqslsc@army.lk
වෙබ් : **www.army.lk/signaller**

## සංඥා සරඹ තනුව SIGNAL MARCH

### Begone, dull care

Begone, dull care !
I prithee begone from me;
Begone, dull care!
Thou and I can never agree //
Long while thou hast been tarrying here,
And fain thou wouldst me kill;
But I' faith, dull care,
Thou never shalt have thy will.//

Too much care
Will make a young man grey;
Too much care
Will turn an old man to clay //
My wife shall dance, and I shall sing,
So merrily pass the day;
For I hold it is the wisest thing,
To drive dull care away. //

Hence, dull care,
I'll none of thy company;
Hence,dull care,
Thou art no pair for me.
We'll hunt the wild boar through the world,
So merrily pass the day;
And then at night, o'er a cheerful bowl,
We'll drive dull care away.

2016 ජුලි මස 04 වන දින ශ්‍රී ලංකා සංඥා බලකායට වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් අභිනවයෙන් "සංඥා ගීතය" එළිදැක්වීම සිදුකරන ලදි. එම සංඥා ගීතය එළිදැක්වෙන මෙම සුවිශේෂී අවස්ථාවේ මේ දක්වා ශ්‍රී ලංකා සංඥා බලකායෙහි සංඥා පෙළපාලි ගී තේමාව වශයෙන් භාවිතයට ගැනෙන බ්‍රිතාන්‍ය රාජකීය සංඥා බලකායෙහිද පෙළපාලි ගී තේමාව වන "Begone Dull Care" ගීතය පිළිබඳව සටහනක් තැබීම කාලෝචිතය.

රාජකීය සංඥා බලකායෙහි පෙළපාලි ගී තේමාව ප්‍රථමයෙන්ම එම බලකායෙහි සංගීත කණ්ඩායමෙහි අධ්‍යක්‍ෂක වශයෙන් 1926 සිට 1939 දක්වා කාල පරිච්ඡේදයෙහි කටයුතු කල Major R R Ricketts, යන නිලධාරී විසින් නිර්මාණය කරන ලදි.

සම්ප්‍රදායික ගී තනුවක් වන "Begone Dull Care" සහ "New Castle" අනුසාරයෙන් සැදුම්ලත් රාජකීය සංඥා බලකා පෙළපාලි සීඝ්‍ර පා ගමන් ගී තේමාව 1960 දශකයෙහි බලකායෙහි සංගීත අධ්‍යක්‍ෂක වශයෙන් කටයුතු කල Lt Col C H Pike විසින් සම්පාදනය කරන ලද්දකි.

"Begone Dull Care"යනුවෙන් ජනප්‍රිය සරල ගීතයෙහි පුරාතණය බ්‍රිතාන්‍ය පාලනය කල දෙවන ජේම්ස් අධිරාජ්‍යයේ රජ සමය (1685-1688) දක්වා අතීතයක් සනිටුහන් කරන අතර එහි මූලික සම්පාදනය ප්‍රංශ ගී පද මාලාවකින් උපුටා ගැනීමක් විය හැකි යැයි අනුමාන කර ඇත.

මෙහි නූතන ගී පද මාලාවන් යෝක්ෂයර් ප්‍රාන්ත ඉපැරණි ජන ගායනයන් ඇසුරෙන් උපුටාගෙන ඇත. මෙම ගීතයෙහි තෙවන පද මාලාව බටහිර යෝක්ෂයර් ප්‍රාන්තිකයන් විසින් ගයනු ලැබුවද ගීතයෙහි මුද්‍රිත පද මාලාවට ඇතුලත්ව නොමැත.

සැකසුම:- බ්‍රිගේඩියර් එල්එස්පී පෙරේරා යූඑස්පී



The SIGNALLER

## පටුන




01 පණිවුඩ
06 ඉතිහාසයෙන් බිඳක්
09 මතක පොතින්
68 අප නොදත් යටගියාව
64 ක්‍රීඩා
75 ඇස ගැටුනු තැන්
86 පාඨමාලා
88 මණ්ඩාකිණිය
94 කැටපත් පවුර
101 උපන්දින සුභ පැතුම්
105 මංගල සීනු
109 ගෞරවනීය උපහාර










## සංඥා බලකාධිපති හා ප්‍රධාන සංඥා නිලධාරීගේ පණිවුඩය

වසර 74 ක අභිමානවත් ඉතිහාසයකයට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බලකායේ 11 වන බලකාධිපති වශයෙන් "ද සිග්නලර්" සඟරාවේ 19 වන කලාපය වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කිරීමට හැකිවීම සම්බන්ධයෙන් මා අතිශයින්ම සතුටට පත් වෙමි. වර්තමාන යුධ හමුදාව තුළ භාවිතා වන තාක්ෂණික හා පරිඝනක උපාංගයන් හා පද්ධතින් භාවිතා කරමින් යුධ හමුදා සන්නිවේදන ජාලයන් අද දින පවතින උසස් මට්ටමට ගෙන ඒම සඳහා ආදී සහ වත්මන් සමාජිකයින් ලබාදුන් අසීමිත දායකත්වය සංඥා බලකාධිපති වශයෙන් මා මෙහිදී සිහිපත් කරනුයේ ඉතාමත් අභිමානයෙනි.

පසුගිය 30 වසරක කුරිරු යුද්ධමය කාලපරාසය තුළ සන්නිවේදනයේ පෙරගමන්කරු වන අප බලකායට කීර්තියක් ගෙන දෙමින් හා ක්‍රියාන්විත රාජකාරීන් හි යෙදී සිටියදී ප්‍රාණ දානය දුන් සියළු නිලධාරී/සෙසුනිලයින්ටත් සටනේදී කාය දානය දී රණඝෂිතභාවයට පත් සියළු නිලධාරී/ සෙසුනිලයින්ටත් මාගේ ගෞරවය හා ආචාරය මෙහිදී පුදකර සිටිමි.

ශ්‍රී ලංකා යුද හමුදාව වෙත අවශ්‍ය පරිදි නවීන සන්නිවේදන හා තොරතුරු තාක්ෂණික ක්‍රමෝපායන් කාර්යක්ෂමව උපයෝගි කර ගනිමින් සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ සේවාවන්ට ආවේනික ගුවන් විදුලි ජාල නවීකරණය කිරීම, පරිගණක මෘදුකාංග පද්ධති/ ව්‍යාපෘති සැකසීම, වෙබ්අඩවි නිර්මාණය කිරීම හා එම පද්ධති සංවර්ධනය කර යාවත්කාලින කිරීම හා සයිබර් ආරක්‍ෂන ඒකකය දිරිමත් කොට එම නිලධාරීන්/ සෙසුනිලයින් ගේ සන්නිවේදන හා තොරතුරු තාක්‍ෂණය පිළිබඳව විධිමත් වෘත්තිය හැකියාවන් වර්ධනය කිරීමට මේ වන විටත් ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබේ. නවීන තාක්‍ෂණයෙහි ඉදිරියට පියමං කිරීමේ හැකියාව ලබාදිමට කටයුතු කිරීම කාලෝචිත බැවින් ඒ සඳහා ප්‍රමුඛත්වයක් ලබා දිම පිණිස මේ වන විට අවශ්‍ය පියවර රැසක් ගෙන තිබෙන අතර, අනාගතයේදි ඒ සඳහා විශේෂ අවධානයක් යොමුකර අපේක්‍ෂිත ඉලක්කයන් කරා ළඟාවීමට අවශ්‍ය කටයුතුද සංඥා බලකාය විසින් සිදුකරමින් පවති.

නිලධාරී/සෙසුනිලයින්ගේ සුභසාධන කටයුතු විධිමත් කිරීම තුළින් ඔවුන්ගේ චිත්ත ධෛර්යය ඉහළ මට්ටමක තබා ගැනිමට ක්‍රියාකර ඒ තුලින් ඵලදායි සේවයක් ලබාගැනිමට හැකිවන බැවී මා තරයේ විශ්වාස කරන බැවින් සුභසාධන කටයුතු තව දුරටත් ක්‍රමවත්ව සිදුකිරීමේ අරමුණේ නියමු ව්‍යාපෘතින් සිදුකිරීමට ද කටයුතු යොදා තිබෙන බව සඳහන් කල යුතුවේ.

ඉන් එක් අඛණ්ඩ ව්‍යාපෘතියක් වන සංඥා බලකායේ කාලින සිදුවීම් පිළිබඳව අප සාමාජිකයින් දැනුවත් කිරීම හා නිර්මාණශිලි හැකියාවන් ඇති අයවලුන්ගේ කුසලතාවයන් වැඩි දියුණු කිරීමේ තෝතැන්නක් බඳු "ද සිග්නලර්" සගරාව දිනෙන් දිනම දියුණුවට පත්වේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරන අතර, සංඥා බලකායේ සියලුම නිලධාරීන්/සෙසුනිලයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත්, නිරන්තරයෙන් අප හා එක්ව කටයුතු කරන සිවිල් සේවක කාර්ය මණ්ඩලයට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් සාමය සතුට සපිරි සෞභාග්‍යමත් අනාගතයක් උදා වේවායි ප්‍රාර්ථනා කරමි.

බී එච් එම් ඒ විජේසිංහ යුඑස්පි එන්ඩියු පිඑස්සි
මේජර් ජෙනරල්
සංඥා බලකාධිපති/ප්‍රධාන සංඥා නිලධාරී

## අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණයගේ පණිවුඩය



අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ වශයෙන් 19 වන "ද සිග්නලර්" සඟරාව සඳහා මා මෙම පණිවුඩය නිකුත් කරනුයේ හද පිරි සතුටිනි. අභිමානවත් හමුදාවක සාමාජිකයින් වශයෙන් අප සියලු දෙනා මෑත අතීතයෙහි සටන් භූමිය තුළ අපගේ පරිනතභාවය පිළිබිඹු කළෙමු. නමුත් මුලු මහත් ලෝකයෙහිම දිනෙන් දින සිදු වන තාක්ෂණික දියුණුවත් සමඟ අනෙක් යුද හමුදාවන් සමග තරඟකාරීව කටයුතු කිරීම සඳහා අප යුද හමුදාවද තාක්ෂණිකව සන්නද්ධ වීම අත්‍යවශ්‍ය වේ. මෙම තාක්ෂණික දියුණුව කරා යන ගමනෙහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රධානතම සාධකයක් වේ. එවැනි පසුබිමක් තුළ ශ්‍රී ලංකා සංඥා බලකායෙහි නිලධාරීන් සහ සෙසුනිළයන් හට තම දක්ෂතාවයන් සහ හැකියාවන් ඉදිරිපත් කිරීමට "ද සිග්නලර්" සඟරාව හරහා අවස්ථාව ලබාදීම බෙහෙවින් අගය කොට සළකමි.

තාක්ෂණික දියුණුවත් සමඟ නවීන තොරතුරු තාක්ෂණ මෙවලම් ලොව පුරා ඉතා අධික ලෙස භාවිතා කරමින් සිටිනු ලබන අතර, ඒ හා සමගාමීව ලෝකයේ යුද හමුදාවන්ද තම කාර්යන් ඉටුකර ගැනීම සඳහා නවීන තාක්ෂණය බෙහෙවින් උපයෝගි කරගනී. තවද එලෙස තාක්ෂණික මුහුණුවරක් කරා ලෝකය පිය නැගීමේදී ඒ හා සමගාමීව යහපත් මෙන්ම අයහපත් බලපෑම්ද ඇතිවන බව පෙනී යයි. හුදෙක් සයිබර් අවකාශය තුළ සයිබර් අපරාධ (Cyber Crime) සහ ත්‍රස්ටවාදය (Cyber Terrorism) යන දෙඅංශයෙන්ම ක්‍රියාකාරකම් සිදුවේ. ඒ අනුව නවීන තාක්ෂණික දියුණුවත් සමග පුද්ගලයින්ට හෝ දේපලවලට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය, මුදල් ජාවාරම් සහ වංචනික ක්‍රියාවන් වැනි අහිතකර තත්වයන් වැඩිවෙමින් පවතී. එවන් අයහපත් ක්‍රියාවන්ට එරෙහිව තාක්ෂණික මෙවලම් භාවිතා කර උපායශීලිව සතුරන් සමඟ සටන් වැදීමට අපද ඒ හා සමාන තාක්ෂණයකින් සන්නද්ධ විය යුතුය. ඒ නිසා එවැනි අවස්ථාවකට මුහුණදීම සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් අප පෙර සූදානම් වෙමින් පවතී.

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමස්ථ යුද හමුදාවේම අභිවෘද්ධිය උදෙසා ආරම්භ කරන ලද හැඳුනුම්පත් ව්‍යාපෘතිය, යුද්ධ හමුදා වෙබ් ද්වාරය(Army Web Portal) නිළධාරී ප්‍රවර්ධන තොරතුරු පද්ධතිය, සෙසුනිල ප්‍රවර්ධන තොරතුරු පද්ධතිය ආදි සමස්ථ යුද්ධ හමුදාවේ නිළධාරී/සෙසුනිලයින් වෙත තොරතුරු තාක්ෂණ සැලසුම් සහ මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘති තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදුකරනු ලබයි. එම පද්ධතින් ශ්‍රී ලංකා යුද හමුදාව ලොව අනෙකුත් යුද හමුදාවන් අතර ඉතා උසස් ස්ථානයකට රැගෙන ඒමට ඉවහල් වී ඇත. එමෙන්ම යුද හමුදා පස් අවුරුදු සහ දස අවුරුදු සැලැස්ම යටතේ සයිබර් ආරක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නුදුරේදීම සයිබර් ආරක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයක් පිහිටුවීමටද යෝජනා වී ඇත. එමඟින් සමස්ථ යුද හමුදා සාමාජිකයින් හට තම සයිබර් ආරක්ෂණ දැනුම ඔප් නංවා ගැනීමට හැකිවනු නොඅනුමානය.

තවද තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ සේවය කරන සංඥා බලකායේ සියළුම තොරතුරු තාක්ෂණ වෘත්තියවේදින් හට ශ්‍රී ලංකා යුද හමුදාවෙහි තොරතුරු තාක්ෂණ විෂයෙහිලා අවැසි විසඳුම් ලබා ගැනීම සඳහා ඔවුන් විසින් දක්වන ලද විශිෂ්ඨ වූ දායකත්වය, කැපවීම සහ නොපසුබට උත්සාහය ඇඟයීම සඳහා මම මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම ඔවුන්ගේ සියළුම අනාගත කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

අවසාන වශයෙන් මෙවැනි අධ්‍යාපනික වටිනාකමක් ඇති සඟරාවක් පලකර ගැනීම සඳහා ගන්නා ලද මෙම ව්‍යායාමය සඳහා "ද සිග්නලර්" සඟරාවෙහි කතෘ මණ්ඩලයට මගේ හද පිරි කෘතඥතාවය පලකිරීමට කැමැත්තෙමි. සයිබර් හා විද්‍යුත් චුම්බක මාධ්‍ය පිළිබඳ වූ තොරතුරු බෙදාගැනීම සඳහා වන ස්ථිරසාර දායකයෙකු ලෙස "ද සිග්නලර්" සඟරාවෙහි අනාගත ගමන් මඟට මම හද පතුලෙන්ම සුභ පතමි.

ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩියු පීඑස්සී
බ්‍රිගේඩියර්
අධ්‍යක්ෂක තොරතුරු තාක්ෂණ



## සංඥා බලසේනාධිපතිගේ පණිවුඩය



ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් පල කරනු ලබන "ද සිග්නලර්" සඟරාවේ 19 වන කලාපය වෙනුවෙන් සංඥා බළසේනාධිපති වශයෙන් පසුගිය වර්ෂයක කාලයක් තුල සංඥා බලකා මාතාව සපැමිණි ගමන් මඟ දෙස බලන කල මෙම ප්‍රකාශණය එළි දැක්වීම සඳහා විශේෂ පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද වරප්‍රසාදයක් මෙන්ම භාග්‍යයක් කොට සලකමි.

යුද්ධය අවසන් වී වසර අටක් ගෙවී ඇති මෙවන් අවධියක ශ්‍රී ලංකා යුද හමුදාව තුල විශාල කාර්යය භාරයක් සංඥා බලකාය වෙත පැවරී ඇත. දිනෙන් දින දියුණු වෙමින් පවතින ලෝක තාක්ෂණය හමුවේ නුදුරු අනාගතයේදී ශ්‍රී ලංකා යුද හමුදාවද නවීන තාක්ෂණයෙන් පිරිපුන් යුද හමුදාවක් වන බව අභිමානයෙන් යුතුව පෙන්වා දිය හැකිය.

ඒ අනුව විදේශිය ආරක්ෂක අංශ නියෝජිතයින් දිවයිනට පැමිණ දේශිය ආරක්ෂක අංශ නියෝජතයින් සමග නොයෙකුත් අභ්‍යාසයන්ට/පාඨමාලාවන්ට සහභාගි වන බවත්, ඒ අතුරින් "දියකාව" ඒකාබද්ධ යුද අභ්‍යාසය සුවිශේෂී වන අතර, ඒ සඳහා වන සංඥා සම්බන්ධතාවය ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය අධීක්ෂණය යටතේ සංඥා බළසේනා මූලස්ථානයේ සම්බන්ධිකරණය යටතේ නවීනතම තාක්ෂණික උපකරණ යොදා සිදු කරනු ලබන බැව් පෙන්වා දෙමි.

පසුගිය කාල වකවානුව තුල දිවයිනේ සිදුවූ නායයෑම්/ගංවතුර ගැලීම් හා අනෙකුත් ස්වාභාවික විපත් සිදුවූ අවස්ථාවන්හි විපතට පත්වූවන් බේරා ගැනීම සහ ඔවුන්ට සහන සැලසීම සඳහා සහභාගිවූ භට පිරිස් සඳහා සංඥා සම්බන්ධතාවය ලබාදීම හා දේශිය හා විදේශිය ප්‍රභූවරුන් හා යුධ හමුදා ජ්‍යෙෂ්ඨ නිළධාරීන් දිවයිනට පැමිණි විට පවත්වනු ලබන උත්සව සහ සම්මන්ත්‍රණ සදහාත් මෙම බලසේනා මූලස්ථානයේ අධීක්ෂණය යටතේ සංඥා සම්බන්ධතාවය ලබාදීම සිදුවූ බව සදහන් කරනු කැමැත්තෙමි.

තවද මෙම සඟරාවෙහි සාර්ථක එළි දැක්වීම උදෙසා වෙහෙසී ක්‍රියාකල සංස්කාරක මණ්ඩලයටත් මෙම සඟරාව සඳහා නිර්මාණ ආදිය සපයමින් විවිධාකාරයෙන් දායකවූ සියළු දෙනාටත් අවසාන වශයෙන් ශ්‍රී ලංකා සංඥා බළකායෙහි නිළධාරීන්ටත් සෙසුනිළයින්ටත් ඔවුන්ගේ පවුල්වල සැමටත් සිවිල් සේවක මහතුන් සහ ඔවුන්ගේ පවුල් වල සැමටත් සෞභාග්‍යය පිරි අනාගතයක් උදෙසා සුභාශිංෂණය පුද කරමි.

එම් ටී වෛද්‍යරත්න
බ්‍රිගේඩියර්
සංඥා බලසේනාධිපති

## සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකගේ පණිවුඩය



74 වසරක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බලකාය පුරා තිස්වසරක යුධ සමයේදී ලද අත්දැකීම් සමුදාය සහ ගෝලීය තාක්‍ෂණික පුනරුදයේ නව මංපෙත් සමස්ථ යුධ හමුදාවේ අනාගත සන්නිවේදන අභිවෘද්ධිය උදෙසා දායාද කිරීම සඳහා අප්‍රමාණ කැපවීමෙන් කටයුතු කරන්නා වූ මේ මොහොතේ සංඥා බලකායේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ නිර්මාණශීලි හැකියාවන් සහ කුසලතාවයන් වැඩි දියුණු කිරීමේ මහඟු කාර්යයට උරදී කටයුතු කරන "ද සිග්නලර්" සඟරාවේ 19 වන කලාපය එළිදක්වන මේ මොහොතේ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් පණිවුඩයක් ගෙන ඒමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි.

වෘත්තිය සංඥා සෙබළුන්ගේ ඒකාකාරී රාජකාරී මානසිකත්වයෙන් මිදී ඔවුන්ගේ සැඟවුනු දක්‍ෂතා නිර්මාණශීලිව එළි දැක්වීමට මහගු තෝතැන්නක් ලෙස "ද සිග්නලර්" සඟරාව ඔබ වෙත ප්‍රදානය කරන අතර, එය සංඥා බලකා සාමාජික සාමාජිකාවන් හා සමස්ථ යුද්ධ හමුදාව වෙතම ගෙනහැර දැක්වීම සඳහා අඛණ්ඩව 19 වන වරටත් ඉදිරිපත් කිරීමට හැකිවීම සමස්ත සංඥා බලකායම ලද ජයග්‍රහණයකි.

අතිසාර්ථකව "ද සිග්නලර්" සඟරාවේ 19 වන කලාපය එළිදැක්වීම සඳහා නව නිර්මාණ, අදහස් හා නොයෙකුත් තොරතුරු ලබා දුන් සංඥා බලකායේ සියලු සාමාජික සාමාජිකාවන්ට හා පසුගිය වසර අග භාගයේ සිට මේ දක්වා සංඥා බලකාය ගමන් ගත් ජයග්‍රාහී මාවත නිර්මාණශීලි සහ ගුණාත්මකව ඔබ වෙත ගෙන ඒමට වෙහෙස මහන්සි වූ මෙම සඟරාවේ සංස්කාරක මණ්ඩල සාමාජිකයින්ට මාගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටින අතර, " ද සිග්නලර් " සඟරාව දිනෙන් දින ගුණාත්මක හා කාලෝචිත සඟරාවක් ලෙස ඉදිරිපත් කිරීමට හැකියාව ලැබේවායි මා ඉත සිතින් ප්‍රාර්ථනය කරමි.

පී ඒ ජේ පීරිස්
බ්‍රිගේඩියර්
රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක





# ඉතිහාසයෙන් බිඳක්

# ශ්‍රී ලංකා සංඥා බලකායේ ආරම්භයේ සිට බිඳක්

දෙවන ලෝක සංග්‍රාමය අවසානයේ බ්‍රිතාන්‍ය හමුදාවල සේවය කල ඇතැම් නිලධාරීන් සහ සෙසුනිලයන් තම හමුදාවලින් විසිරයෑමෙන් පසු 1949 ලංකා යුද හමුදාව ගොඩනංවන ලදී. එම හමුදාවට සංඥා ඒකකයක් 1950 වර්ෂයේදී ආරම්භ විය. බ්‍රිතාන්‍ය හමුදාවේ Royal Signals අනුගමනය කරමින් Ceylon Signals නමින් උරහිස් පළඳනාව සමඟ නිල ඇඳුම යොදාගන්නා ලද අතර, මෙම ඒකකය කොළඹ එච්ලන් චතුරස්‍රයේ දැනට ලංකා බැංකු විශාල ගොඩනැගිල්ල ඇති ස්ථානයේ බ්‍රිතාන්‍ය හමුදා ගොඩනැගිල්ලක කඳවුරු ගත විය. ඒකකය සංඥා බලඝණයක් වූ අතර, කණ්ඩායම් දෙකකින් සමන්විත විය. HQ & Fortress සහ Field Troop වශයෙන් වෙන්කර ප්‍රථම කොටස මූලස්ථාන සංඥා වැඩපොළ සහ දෙවන කොටස සංඥා මධ්‍යස්ථාන, දුරකථන හා ගුවන් විදුලි අංශයන්ගෙන් සමන්විත විය.

එවකට යුද හමුදාපති බ්‍රිතාන්‍ය ජාතික බ්‍රිගේඩියර් එෆ්එස් රීඩ් වූ අතර, සංඥා බලඝනයේ නිලධාරී අණදෙන මේජර් ඩීවී බ්‍රෝහියර් සහ සෙසුනිලධාරීන් කැප්ටන් එන්ටී ජොබ්ස්, ලුතිතන් එම්ජේඑෆ්ආර් පෙරේරා, ලුතිතන් එල්ජේඅයි ප්‍රනාන්දු සහ 2/ලුතිතන් ඒඑම්එම් ෆරීඩ් විය.

1953 ලංකාවේ පැවති හර්තාල් නොසන්සුන්තාවය නිසා පැවති හමුදා ක්‍රියාන්විතයේදී කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල තත්වය වාර්ථා කරමින් වාහන වල සිට ක්‍රියාත්මක ගුවන් විදුලි ජාල සහ සංඥා යතුරු පැදිකරුවන් සිදුකල හදිසි සේවාවන් අගය කල යුතුය. එවකට කෝප්‍රල් මාටිල් ඒඅයි (පසුව කපිතන්) මෙම ක්‍රියාන්විතයේදී මූලිකව කටයුතු කල අයෙකි.

කොළඹ මැලේවීදියේ බ්‍රිතාන්‍ය හමුදා ගොඩනැගිල්ලක පිහිටුවා තිබූ සංඥා පාසලෙන් ගු.වි මෝස් ක්‍රමය, සංඥා මධ්‍යස්ථාන සහ ගු.වි ජාල පිළිවෙත පුහුණු කිරීම සිදුකෙරිනි.

මෙම කාලයේ සංඥා බලඝණයේ පිරිස සහ වාහන ප්‍රමාණය එතරම් නොතිබුනත් යුද හමුදාවේ කැපී පෙනෙන ඒකකයක් බවට පත් විය. අන්තර් ඒකක ක්‍රීඩා තරඟවලින් ද ඉහල ස්ථානයක් හිමි කරගන්නා ලදී.

1954 වර්ශයේ ඉන්දියාවේ සිට හොර රහසේ බෝට්ටු වලින් ලංකාවේ මන්නාරම් වෙරළට පැමිනෙමින් සිටි අයවලුන් වැලැක්වීම (Op monty) ක්‍රියාත්මක විය. මන්නාරම දිවයින වටා මුහුදු වෙරළ මුර කිරීම යුද හමුදා භට කණ්ඩායම් විසින් සිදු කරන ලදී. මෙම අනු කණ්ඩායම් වලට සංඥා සෙබලුන් විසින් කැලයෙන් කපා ගත් ලී හිටුවා රැහැන් ඇද මුර පලවල් වල සිට තල්ලඩි සහ තොඩ්ඩවලි මූලස්ථාන වෙත (Field) දුරකථන පහසුකම් සලස්වා දෙන ලද අතර, මන්නාරම තොඩ්ඩවලි කඳවුරේ සිට නො:19 ගුවන් විදුලි යන්ත්‍රයක් මෝස් ක්‍රමයෙන් ප්‍රථම වරට මූලස්ථාන ජාලයට එක් විය.

1956 වර්ෂයේ නැගෙනහිර පලාතේ අම්පාර නගරය සහ තදාසන්න ප්‍රදේශවල හටගත් ජාතිවාදී කෝලාහල මැඩපැවැත්වීම සඳහා යුද හමුදාව ක්‍රියාත්මක විය. මේ වන විට එම ප්‍රදේශ වල සිට කොළඹට සිවිල් පණිවිඩ හුවමාරු ක්‍රම සියල්ලම අඩාල වී තිබුණි.

අප ඒකකයට ලැබුණු නියෝග අනුව නො:19 ගුවන් විදුලි යන්ත්‍රයක් හා ක්‍රියාකරුවන් දෙදෙනෙකු සංසෙ සිල්වා එච්බීඑස් සහ සංසෙ දිසානායක ඊඞ් (පසුව කපිතන්) ඉතා ඉක්මණින් අම්පාර නගරයේ යුධ හමුදා අනු කණ්ඩය බලා පිටත් කෙරුණි. සාමකාමී නොවූ ජනතාවක් සිටි දුෂ්කර මාර්ගයක් ඔස්සේ අම්පාරට ගොස් යුද හමුදා කඳවුරේ සිට මෝස් ක්‍රමයට පණිවිඩ යැවීම ආරම්භ විය. සිවිල් ටෙලිග්‍රෑම් පවා මෙමගින් හුවමාරු විය.

බ්‍රිතාන්‍ය එලිසබෙත් මහ රැජින සිහසුන් ගත කිරීමේ බ්‍රිතානයේ පැවති රාජකීය උළෙල නියෝජනය කල ලංකා යුද හමුදා කණ්ඩායමට සංඥා බළඝනයෙන් ලා/කෝ දේවරාජා ඇතුළත් කරන ලදී.

මහ රැජින ලංකාවට පැමිණි දින සිට පැවැති සෑම නිළ උත්සවයකටම සහ නිදහස් උත්සවයන්ට අප ඒකකකය සහභාගි විය.



The SIGNALLER

එවකට සංඥා බළඝනයේ සිටි එකම බනි II සාජන්ට් මේජර් පසේලා (පසුව මේජර්) විසින් රෙජිමේන්තු සරඹ සහ පෙළපාලි සඳහා ඒකකය සූදානම් කිරීමට දක්වන ලද කැපවීම අගය කළ යුතුය.

1957 දී කොළඹ එච්ලින් බැරැක්ක අනාකැර පනාගොඩ හමුදා ජනපදයේ නව ගොඩනැගිලිවල සංඥා බළඝනය ස්ථාපනය කරවන ලදී. මන්නාරම දූපතට පැමිණෙමින් සිටි ඉන්දියානු අයවලුන් අත්අඩංගුවට ගැනිම සඳහා කර්නල් ආටිගලගේ මූලිකත්වයෙන් එච්ලන් බැරැක්කයේ රෝහල් වීදියේ ආරම්භ කරන ලද TAFAII මූලස්ථානය යුද හමුදාව සහ නාවික හමුදාව එකතුව ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියාන්විතයේ ගුවන් විදුලි පණිවිඩ යැවීමට සංඥා බලකායේ ගු.වි ක්‍රියාකරුවන් සහ නාවික හමුදාවේ ගු.වි ක්‍රියාකරුවන් යොදා ගනිමින් යුද සහ නාවික හමුදා ඒකාබද්ධ ගුවන් විදුලි ජාලයක් එච්ලන් චතුරශ්‍රයේ ක්‍රියාත්මක කරන ලදී.

ගරු ඩඩ්ලි සේනානායක මහතා අගමැතිධුරය දරණ ලද කාලයේ පිළියන්දල ප්‍රදේශයේ විශාල කුඹුරු යායවල කොළඹ සහ අවට පාසල්වල සිසුන් ලවා වල්පැළ නෙලීමේ මහ උත්සවයක් පැවැත්විය. මෙම කාලය වැසි සහිත විය. එම නිසා උදෑසනම එම වෙල්යායවල් අසල සිට කාලගුණ තත්වයන් දන්වා පාසල් දැනුවත් කිරීමට සංඥා බලකායේ ගුවන් විදුලි යන්ත්‍රයක් ස්ථාපනය කළ වාහනයක් ක්‍රියාත්මක විය. මෙම ගු.වි ස්ථානය දිනපතා හා දවස පුරා උත්සවයන් පැවති දිනවල ක්‍රියාත්මක විය.



විශ්‍රාමික බනි I එච් බී එස් සිල්වා (සෙ/65081) විසින් "ද සිග්නලර්" සඟරාවට පලකිරීම සඳහා ලබා දී ඇත.

1960 වර්ෂයේ මුල්භාගයේ පැවති වරාය වැඩවර්ජන වලදී නැව්වල සිට ගොඩබිමටත් ගොඩබිම සිට නැව්වලටත් බඩු ගොඩබෑම පැටවීම දොඹකර Winch මාර්ගයෙන් ක්‍රියාත්මක කිරීම සංඥා බලකාය විසින් සිදුකරන ලදී.

සෞඛ්‍යදාන ව්‍යාපාරය විසින් මෙහෙයවන ලද ශ්‍රීපාද ස්ථානයේ පාමුල සිට උඩ මලුව දක්වා අසනීපකරුවන්ගේ තොරතුරු පාමුල සිට වෛද්‍ය කඳවුර වෙත වාර්තා කිරීමේ මෙහෙයුමට සංඥා බලකාය නො:31 ගු.වි යන්ත්‍ර සහ සංඥා ක්‍රියාකරුවන්ද සපයා දෙන ලදී.

අම්පාරේ සහ කන්තලේ සීනි කර්මාන්තශාලා සහ එම පලාත්වල උක්වතුවල උක් කැපීමේ යුද හමුදා මෙහෙයුමට එක් වූ පුරෝගාමී බලකායේ සීනි කර්මාන්ත ශාලා මූලස්ථානයට සහ එම අනුකණ්ඩ වල සහයට ගු.වි යන්ත්‍ර සහ Field Telephones මගින් දුරකථන පහසුකම් සලසා දීම ද සංඥා බලකාය මගින් සිදුකරන ලදී.

ශ්‍රීලංකා සංඥා බලකාය සීඝ්‍ර ලෙස ගොඩනැගි විශාල රෙජිමේන්තු ගණනාවක් සමග ඉදිරියට ඇදීගෙ ස් ඇත්තේ 1952 සිට මේ දක්වා එහි සේවය කල නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ කැපවීමෙන් සහ උනන්දුවෙන් හා විශාල මෙහෙයන්ගෙන් බව කිව යුතුය.

# සංඥා බලකා සිරස්ක ලාංඡනයෙහි ඉතිහාසය

**බ්‍රිගේඩියර් එල් එස් පී පෙරේරා යූඑස්පී විසිනි**

19 වන ගත වර්ෂයෙහි බ්‍රිතාන්‍ය රාජකීය යුද හමුදාවෙහි සංඥා සම්බධතාවය පවත්වා ගැනිම සඳහා, සංඥා බලකායක් නොතිබුනු අතර, එම රාජකාරි වග කිම රාජකිය ඉංජිනේරු බලකාය විසින් ඉෂ්ඩ කරන ලදි. එම අවදියේදි සංඥා සම්බන්ධතා කටයුතු ඒ සඳහා සැකසු කුඩා ධජයන් සහ ආලෝක ධාරාවන් උපයෝගි කරගෙන සිදු කරන ලදි. 1850 දශකය වන විට ටෙලිග්‍රාප් සහ මෝසකෝඩ් මගින් සංඥා සම්බන්ධතාවය ස්ථාපනය කිරීමත් සමග රාජකිය ඉංජිනේරු බලකායද යුධ හමුදාවෙහි සංඥා සම්බන්ධතා කටයුතු සඳහා එම උපකරණයන් උපයෝගි කර ගන්නා ලදි. රාජකිය ඉංජිනේරු බලකාය යටතේ සංඥා සම්බන්ධතාවය සඳහා මුලිකවම ස්ථාපිතව අත්තේ සි බණ්ඩය ( C Troop ) වේ. ඒ 1870 සැප්තම්බර් මස 01 වන දිනය. 1880 දශකය මුල් භාගය වන විට මෙම බණ්ඩය බළඝණයක් තත්වයට වර්ධනය විමත් සමග එය ටෙලිග්‍රාප් බළඝණය සමග ඒකාබද්ධව 1884 දි ටෙලිග්‍රාප් බළඇණියක් වශයෙන් රාජකිය ඉංජිනේරු බලකාය යටතේ ස්ථාපනය වි ඇත.

මෙම ටෙලිග්‍රාප් බළඇණියෙහි ප්‍රථම අණදෙන නිළධාරි වූ මේජර් සිඑෆ්සි බ්‍රෙස්ෆොඩ් ( Major CFC Beresford ) විසින් බළඇණිය සඳහා විශේෂිත වූ ලාංඡනයක අවශ්‍යතාවය අවධාරණය කර ඒ සඳහා ඔහු විසින්ම සිදු කල යෝජනාවකට අනුව එම බලඇණියෙහි ලාංඡනය ලෙස මර්කරි දෙවිදුන්ගේ රුව යොදාගෙන ඇත. ග්‍රීක සහ රෝම දේව ධර්මයෙහි සංඥා සම්බන්ධතා පණිවිඩකරු වගකිම දැරූ දෙවිදුන් වශයෙන් ප්‍රචලිත මර්කරි හෙවත් හර්මිස් දෙවිදුන්ගේ අනුරුව ටෙලිග්‍රාප් බලඇණියෙහි ලාංඡනය වශයෙන් යොදා ගැනිම සම්බන්ධව එම බලඇණියෙහි භඨ පිරිස් අතිශයින් කැමති විය.

මෙම රුව බලඇණි ලාංඡනය වශයෙන් යොදා ගැනිමට ඔහු වෙත ප්‍රස්තුත වූ අදහස වශයෙන් අනුමාන කරනු ලබන්නේ ඔහුගේ පියා විසින් 1851 වසරේදි හයිඩ්පාර්ක් හි පැවති ප්‍රදර්ශණයකින් මිලදි ගන්නා ලද මර්කරි දෙවිදුන්ගේ අනුරුවක් නිසා බවය. මෙම අනුරුවෙහි මුලික ප්‍රථිමාව ග්ලම්බොලොංඥ Giambologna (Jean do Boulogne ) විසින් 1578 - 1580 කාල පරිච්ඡේදය තුල නිර්මාණය කරන ලදි. ෆ්ලොරන්ස් හි පිටි පැලැස්හි ( Pitti Palace, Florence ) ස්ථාපනය කර තිබූ පිළිරුවෙහි ප්‍රති නිර්මාණයකි. මෙම ප්‍රතිමාව පසුව කෙම්බර්ලි (Cembrly ) උද්‍යානයෙහි ස්ථාපිත කර ඇත. 1891 දි මේජර් බ්‍රෙස්ෆෝඩ් සහ ලුතිතන් සිජේ එල්කින්ටන් ( Lt CJ Elkington ) විසින් නිර්මාණ දායකත්වය සිදුකර මර්කරි අනුරුව ඇතුලත්ව සැකසු චේත්‍රයක් බලඇණි තූර්ය වාදක කණ්ඩායම වෙත ප්‍රධානය කරන ලදි. තූර්ය වාදක කණ්ඩායමෙහි චේත්‍රය සහ මේජර් බෙරෙස්ෆොඩ් ගේ පියා සතුවූ මර්කරි පිළිරුව (බෙරෙස්ෆොඩ් පිමි ) කෞතුක භාණ්ඩ වශයෙන් බලකාය සතුව ඇත.

මර්කරි දෙවිදුන්ගේ ලාංඡනය "පිමි" යන අන්වර්ථ නාමය එක්විමට පාදක වූ හේතුන් පිළිබඳව නිශ්චිත සාධකයක් නොමැති වුවද එය සිදුවිමට හේතු කාරණා වශයෙන් නොයෙකුත් මත පලකර ඇත. මෙයට හේතුවක් වශයෙන් වූ 1921 සිට 1929 දක්වා බලකාය නියෝජනය කල 1924 රාජකිය යුධ හමුදාවෙහි බොක්සිං කිරුළ හිමිකර ගත් ජමි එම්බිලම් Jimmy Emblem යන ක්‍රිඩකයාගේ නාමය නිසා බැව් මතයක් පවති. එම්බිලම් යන්නෙන් අදහස් කරනුයේ ලාංඡනය යන්න බැවින් පිමි අපගේ ලාංඡනය යන්න සොල්දාදුවන් අතර ප්‍රචලිත විමෙන් එම අන්වර්ථ නාමය භාවිතා කරන්නට ඇතැයි මත දරයි.

කෙසේ නමුත් මෑතකදි සොයා ගන්නා ලද බ්‍රිගේඩියර් ක්ලෙමන්ඩ් ස්මිත් ( Brig Clemend Smith ) ගේ මතක සටහනකට අනුව 1904 වර්ෂයෙහි භාවිතා කල තූර්ය වාදක කණ්ඩායමෙහි චේත්‍රය පිලිබඳව ඔහු විසින් එවකට දක්වා ඇති විස්තර සටහනෙහි "පිමි" යන නාමය ඔහු විසින් සඳහන් කර ඇති බැවින් මෙම නාමය භාවිතය 1920 දශකය පූර්ව අතිතයක් ඇති බව සනාථ වි ඇත. පිමි යන අන්වර්ථ නාමය යෙදිමට හේතු සාධක වූ තවත් කරුණක් වශයෙන් අනුමාන කරනු ලබන්නේ මෙම පිළිරුවෙහි මුලික නිමවුම්කරු වශයෙන් හැඳින්වෙන ග්ලම්බොලොංඥ පින් ද බොලොංඥ Glambolongna ( Jean do Boulogne ) ගේ නම පාදක කරගෙන සිදුවූවක් යන්න මතයයි.

මර්කරි රුව ඇතුලත් සිරස්ක ලාංඡනය සංඥා බලකායට ඇතුලත් වූයේ 1921 මාර්තු මස 24 දින



The SIGNALLER

පස්වන ජෝර්ජ් රජතුමාගේ අනුමැතිය ඒ සඳහා ලැබීමෙන් අනතුරුවය. මෙම සිරස්ක ලාංඡනය වම් අතෙහි යෂ්ඨියක් ද මර්කරි අනුරුව ලෝක ගෝලය සහද දෙපසට විහිදුනු ලෝරල් ශාක පත්‍ර පසුබිමක් ද සහා ඕවලාකාර පටියකින් සමන්විත විය. "CERTA CITO" ( ස්ථිර සෂණික ) ග්‍රීක උද්ධෘත පාඨය 1929 වසරේ දී පස්වන ජෝර්ජ් රජතුමා විසින් බලකාය වෙත අනුමත කරන ලදි. 1946 වසරේදි "CEATA CITO" පාඨය වෙනුවට "SWIFT AND SURE" ( ස්ථිර සෂණික) පාඨය ඇතුලත් විය. 1953 වසරේදි එලිසබෙත් රැජිනියගේ අනුමැතිය මත සංඥා ලාංඡනයෙහි රාජකිය ඔටුන්න වෙනසකට භාජනය වූ අතර මේ දක්වා එම ලාංඡනය රාජකිය සංඥා බලකා ලාංඡනය වශයෙන් භාවිතා කරයි.

ශ්‍රී ලංකා සංඥා බලකායෙහි මුලාරම්භයේ සිට භාවිතා කරන ලද රාජකිය සංඥා බලකා ලාංඡනය 1972 පසු ධර්ම චක්‍රය සහ "ස්ථිර සෂණික" පාඨය සමග ප්‍රති නිර්මාණය කර වර්තමානය දක්වා භාවිතයට ගැනේ.




රාජකිය ටෙලිග්‍රාප් බලඇණියෙහි සංඥා ලාංඡනය



1920 - 1946 දක්වා කාලය තුල රාජකිය සංඥා බලකාධිපති ලාංඡනය



1946 - 1956 දක්වා කාලය තුල රාජකිය සංඥා බලකායෙහි ලාංඡනය



1953 සිට රාජකිය සංඥා බලකායෙහි ලාංඡනය



"Ceylon Corp of Signals" කාලවකවානුව තුල භාවිතා කලායැයි සැලකෙන ලාංඡනය



රාජකිය ටෙලිග්‍රාප් බලඇණියෙහි ප්‍රථම අණදෙන නිළධාරි මේජර් සිඑෆ්සි බ්‍රෙස්ෆොඩ් ජායාරූපයෙහි මැද



ෆොලරන්ස් හි බාගලෝ Bargello කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනයට ඇති 1578 - 1580 කාල පරිච්ඡේදය තුල ග්ලම්බොලොංඥ Giambologna (Jean do Boulogne ) විසින් නිර්මාණය කරන ලද මර්කරි ප්‍රතිමාව








## ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය

වර්ෂ 1943 ඔක්තෝබර් මස 19 දින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා සංඥා බලකාය යුද හමුදාවේ ව්‍යාප්තියත් සමග ක්‍රියාන්විත රාජකාරී කාර්ය භාරයන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායි සන්නිවේදන සේවාවක් පවත්වා ගැනීම මූලික කරගෙන 2007.03.12 වන දින යුද්ධ හමුදා චර්යා නියෝග 44/2007 මගින් පනාගොඩ යුද්ධ හමුදා ජනපදය තුලදී ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය ස්ථාපනය කරන ලදී.

ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය එහි ආරම්භයේ සිට ත්‍රස්තවාදයට එරෙහි මානුෂීය මෙහෙයුමෙහි සාර්ථක නිමාව දක්වා වූ තීරණාත්මක කාලය තුල යුද හමුදාවේද, අනෙකුත් හමුදාවන්, පොලිසිය හා සිවිල් ආරක්ෂක අංශය වෙතද අවශ්‍ය පරිදි සන්නිවේදන, තොරතුරු තාක්ෂණ හා විද්‍යුත් සංග්‍රාමික යන විෂයන්හි අනුශාසකත්වය, සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම හා නඩත්තුව යන ක්‍රියාවලියන්හි නිරතවෙමින් විශිෂ්ඨ කාර්යභාරයක් ඉටුකරන ලද අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමක කොමිෂන් සභාව හා ඊට සම්බන්ධ සන්නිවේදන ක්ෂේත්‍රයෙහි නියුතු අනිකුත් සිවිල් ආයතන සමගින්ද මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් ක්‍රියාකරන ලදී.

මෙම මූලස්ථාන යෙහි ප්‍රධාන සංඥා නිළධාරී වශයෙන් 2013.10.04 දින සිට 2017.04.11 දින දක්වා පුරා වසර තුනකට අධික කාලයක් මහගු සේවාවක් ලබාදෙමින් කටයුතු කල මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පි යූඑස්පි එන්ඩියු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමන් ඔහුගේ විශ්‍රාම දිවියට පිවිසෙන ලදී. ඉන් අනුව 2017.04.11 දින මේජර් ජෙනරාල් බිඑච්චිඑම්ජ් විජේසිංහ යූඑස්පි එන්ඩියු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමන් සුභ මොහොතින් ප්‍රධාන සංඥා නිළධාරී තනතුරෙහි වැඩ භාරගෙන මෙම මූලය සඳහා නායකත්වය ලබා දෙමින් සිටී.

ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථාන අධීක්ෂණය යටතේ 10 වන සංඥා රෙජිමේන්තුවෙහි ඔකායා කොයිල් ව්‍යාපෘතිය, 12 වන සංඥා රෙජිමේන්තුව සයිබර් ආරක්ෂණ ඒකකයක් ලෙස නගා සිටුවීම, තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් පාලනය වන මෘදුකාංග සංවර්ධන අංශය, තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණ පුහුණුවීම සඳහා පුහුණු විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම සහ ආපදා කළමණාකරන කටයුතු සඳහා දායකත්වය ලබාදීම (මීතොටමුල්ල කුණු කන්ද නාය යෑම) වැනි භාරදූර කාර්යයන් රැසක් සහ ව්‍යාපෘති රැසක් සිදුවිය.

ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් කටයුතු කරමින් සිටි මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පි යූඑස්පි එන්ඩියු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී තුමන්ගේ මූලිකත්වයෙන් ආරම්භවූ ඇමෙරිකා එක්සත් ජනපද පැසිපික් කලාප සේනාපතිත්වය (US Pacific Command - USPACOM) යටතේ වාර්ෂිකව පවත්වනු ලබන MULTINATIONAL COMMUNICATION INTEROPERABILITY PROGRAMME (MCIP) වැඩසටහනේ 3 වන වැඩමුළුව 2017 මැයි මස 29 දින සිට 2017 ජුනි මස 02 දින දක්වා ආරක්ෂක අමාත්‍යාංශය හා යුද හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත වත්මන් ප්‍රධාන සංඥා නිළධාරී මේජර් ජෙනරාල් බිඑච්චිඑම්ජ් විජේසිංහ යූඑස්පි එන්ඩියු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමන්ගේ මග පෙන්වීම යටතේ මෙවර හිල්ටන් හෝටලයේදී පවත්වන ලදී. මෙම වැඩසටහන මෙම මූලස්ථාන පූර්ණ අධීක්ෂණය සහ සම්බන්ධීකරණය මත 03 වන වරටත් ශ්‍රී ලංකාවේ පැවැත්වූ අතර, මේ සඳහා රටවල් 19 කට අයත් විදෙස් හමුදා නියෝජිතයින් 50 කට අධික පිරිසක් සහභාගි වූහ.

තවද, ඉහත වැඩමුළුවට සමගාමීව වර්තමානයේ ලෝකය මුහුන දී ඇති සයිබර් තර්ජන පිලිබඳ දෙදින වැඩමුළුවක්ද United States Pacific Command (USPACOM) මූලිකත්වයෙන් යුතුව මෙම මූල සංවිධානයෙන් රෙම ශ්‍රීලංසංඛ සාකච්ඡා ශාලාවේදී 2017 මැයි මස 26 හා 27 යන දෙදින තුළ ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් යුතුව පවත්වන ලදී.

යුද්ධ හමුදා සාමාජිකයින් හට පරිගණක දැනුම වෘත්තිය මට්ටමින් ලබදීම සඳහා පනාගොඩ, අනුරාධපුර, මහනුවර, කුරුවිට හා කොකාවිල්හි ආරම්භ කර ඇති රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනයන් මගින් ලිපිකරු පාඨමාලාව හදාරා නික්මයනු ලබන ලිපිකරුවන්/ ලිපිකාරිනියන් උදෙසා පූර්ණ කාලින මසක පරිගණක යෙදවුම්කරණය පිළිබඳව පුහුණු පාඨමාලාවක් පවත්වා ඔවුන්ගේ තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම උදෙසා පාඨමාලා අඛණ්ඩව සිදුකරමින් පවතියි. තවද, තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ලබාදීම සඳහා යුද්ධ හමුදා සාමාජිකයින්/සාමාජිකාවන්ගේ පවුල්වල දූදරුවන් උදෙසා මෙම ආයතනය මගින් සෑම වසරකම විශේෂ පාඨමාලා සංවිධානය කර ඇති අතර පසුගිය වසරේ

පමණක් ඒ සඳහා සහභාගි වී ඇති සංඛ්‍යාව 575 ක් පමණ විය. එම සියු සිසුවියන් සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුවීම් අධිකාරිය (NAITA) මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ වෘත්තිය පරීක්ෂණයන්ටද පෙනී සිටීමේ අවස්ථාවද උදාකර දී ඇත.


මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් 2017.04.11 දින ප්‍රධාන සංඥා නිළධාරී තනතුරින් තික්මයාමේ අවස්ථාවේදී ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානයේ කාර්ය මණ්ඩලය විසින් සමරු ඵලකයක් ප්‍රධානය කිරීම.


මේජර් ජෙනරාල් බීඑච්එම්ජේ විජේසිංහ යූඑස්පී එන්ඩියූ පීඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් විසින් 2017.04.11 දින ප්‍රධාන සංඥා නිලධාරී තනතුරෙහි වැඩ භාරගත් අවස්ථාව.


MCIP වැඩසටහනේ 3 වන වැඩමුළුව සඳහා සහභාගිවූ සමාජිකයින් සමූහ ඡායාරූපයකට පෙනී සිටිමින්.


MCIP වැඩසටහන අවසානයේ යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි විසින් අවසන් දින සහතික පත්‍ර බෙදාදෙමින්.


ලිපිකරු පාඨමාලාව හදාරා තික්මයන යුද්ධ හමුදා සාමාජිකයන් හට හා යුද්ධ හමුදා සාමාජිකයින්/ සාමාජිකාවන්ගේ පවුල්වල දූදරුවන් උදෙසා රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනයන් මගින් පාඨමාලාවන් පැවැත්වෙමින්.


USPACOM විසින් සයිබර් ආරක්ෂාව පිලිබඳ දෙදින වැඩමුළුව පැවැත්වෙමින්.



The SIGNALLER

## තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද හමුදාවෙහි තොරතුරු තාක්ෂණ අංශයෙහි අභිවෘද්ධිය උදෙසා විශාල මෙහෙයක් ඉටුකරනු ලබන අතර එය 2010 මාර්තු 01 වන දින ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය යටතේ ආරම්භ කරන ලදි.

ශ්‍රී ලංකා යුද හමුදාධිපතිතුමාගේ මඟ පෙන්වීම මත ශ්‍රී ලංකා යුද හමුදාව තුළ සියළුම ආයතන සඳහා වූ මෘදුකාංග විසඳුම් සහ ජාල විසඳුම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, නිර්මාණය කිරීම සහ නිපදවීම හා නඩත්තු කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරනු ලබයි. ඉතාමත් සංකීර්ණ වූ ගෘහස්ථ තොරතුරු තාක්ෂණ විසඳුම් නිපදවීමට පහසුකම් සැලසීම සඳහා මෘදුකාංග සංවර්ධන හා ඉංජිනේරු මධ්‍යස්ථානය, දත්ත මධ්‍යස්ථානය, වෙබ් අඩවි අංශය සහ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයද, වර්තමාන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ තුමාගේ අධීක්ෂණය යටතේ ගොඩනගා ඇත. ඊට අමතරව තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය තුළින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ලබා දෙන සේවාවන්හි ආරක්ෂාව සහතික කරනු වස් සයිබර් ආරක්ෂණ ඒකකයක් වශයෙන් 12 වන සංඥා රෙජිමේන්තුව පිහිටුවන ලදි.

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය දෙවන ගණිතඥ, ලූතිතන්, කපිතන් සහ වෙනත් නිලයන්ට ඉදිරාම බඳවා ගන්නා ලද විශේෂඥ දැනුම සහිත මෘදුකාංග . ඉංජිනේරුවරුන්, සහකාර මෘදුකාංග ඉංජිනේරුවරුන්, ජාලකරණ ඉංජිනේරුවරුන්, සහකාර ජාලකරණ ඉංජිනේරුවරුන්, තොරතුරු තාක්ෂණ ආරක්ෂක විශ්ලේෂකයන්, මෘදුකාංග තත්ත්ව පරීක්ෂක ඉංජිනේරුවරුන්, දෘඩාංග ඉංජිනේරුවන්, සහකාර දෘඩාංග ඉංජිනේරුවන්, තොරතුරු තාක්ෂණ නිලධාරීන් අත සහකාර තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා යුද හමුදාවෙහි ඉහළ මූලස්ථාන මගින් පවරනු ලබන තොරතුරු තාක්ෂණ රාජකාරි කඩිනම් අවශ්‍යතා කාර්යක්ෂමව ඉටුකිරීමට එම නිලධාරීන්ගේ විශේෂඥ දැනුම නොඅඩුව ලබා ගැනීම සඳහා ඔවුන් ධෛර්යමත් කිරීම ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානයෙහි සහය ද ඇතිව තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරනු ලබයි.

වර්තමානයෙහි එවැනි තොරතුරු තාක්ෂණ නිළධාරීන් 105 ක්ද පරිගණක ක්‍රියාකරුවන් 1290 දෙනෙකුද ශ්‍රී ලංකා යුද හමුදාවෙහි තොරතුරු තාක්ෂණ අංශයෙහි අභිවෘද්ධිය සඳහා වූ විවිධ ව්‍යාපෘති සහ එම විෂය සම්බන්ධ විවිධ වූ තොරතුරු තාක්ෂණ රාජකාරීන් වල නිරතව සිටින අතර, එම සියළුම ව්‍යාපෘතින් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි නිබඳ අධීක්ෂණය යටතේ සිදු වෙයි.

වර්තමානයේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන සංඥා නිළධාරී, තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ හා තොරතුරු තාක්ෂණ උපදේශක යන නිලධාරින්ගේ දිරිමත් කිරීම සහ මඟ පෙන්වීම යටතේ තම කටයුතු ඉතා සාර්ථකව සහ ප්‍රතිඵලදායක ලෙස සිදුකරගෙන යනු ලබයි. තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතින් වලට යොදන ලද අති විශාල කැපකිරීම් හා දිරීමත් බව හේතු කොටගෙන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන මෘදුකාංග සංවර්ධන හා ඉංජිනේරු මධ්‍යස්ථානය විවිධ වූ සාර්ථක ව්‍යාපෘතින් ගණනාවක් ක්‍රියාත්මක කිරීමට සමත්ව ඇත. එම ව්‍යාපෘතින් පහත සදහන් පරිදි වේ.

<u>නිම කරන ලද මෘදුකාංග ව්‍යාපෘතින්:</u>

(1) Hospital Information Management System.
(2) LDAP and Identity Management System.
(3) Army ID Management Information System.
(4) Enrolment Management Solution for Army ID - R&D.
(5) Army Web / Job Portal / Staging Site for Army Web Update.
(6) Army Web Portal.
(7) Unit Benevolent Fund System.
(8) Officers Career Management & Monitoring System.
(9) Task Manager for Commander/ MA.
(10) Task Manager for Chief of Defence Staff.
(11) Retired Service Personnel Information Management System and Job Bank.
(12) Assets Management System.
(13) NCOs Career Management & Monitoring System.
(14) Web Based Document Management System.
(15) Audit Management System.
(16) Integrated Intelligence and Information Management system.
(17) Bill Settlement System.
(18) Virusara Card Information Management System.

<u>සංවර්ධනය කරමින් පවතින ව්‍යාපෘතින්:</u>

(1) Procurement Management Information System.
(2) Access Control and Identity Management Information System for Army.
(3) Welfare Management Information System.
(4) ERE Information Management System.
(5) Suwasahana Maintenance and New Requirements.
(6) CHRM Maintenance and New Requirements.
(7) Daily Mail Maintenance and New Requirements.
(8) Warehouse Management Information System.
(9) Vote Management System.
(10) Warehouse Management Information Sys for Orthotic & Prosthetics Equipment/Store.
(11) NCC Information Management System.
(12) Housing Project Management System.
(13) KIA/WIA Service Personnel Welfare Management Information System.
(14) Officers Career Management & Monitoring System for SLNG.
(15) P & R Project.

<u>පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතින්:</u>

වර්තමානයේදි ශ්‍රී ලංකා යුද හමුදාව තාක්ෂණිකව සංකීර්ණ වූ පද්ධති මිලදී ගැනිම හරහා තාක්ෂණිකව පරිපූර්ණ යුද්ධ හමුදාවක් බවට පරිවර්ථනය වීම ආරම්භ කර ඇත. තවද ඔවුන් විසින් ගන්නා ලද වැයමේ ප්‍රථිඵලයක් ලෙස පහත සඳහන් ව්‍යාපෘති මේ වන විට තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් නිමකර දිවයිනේ ප්‍රධාන පෙලේ ප්‍රදර්ශණ ගණනාවකදි සාර්ථකව ඉදිරිපත් කර ඇත.

(1) Small Arm Firing Simulator.
(2) GPS Guided Quad copter.
(3) Throw Robot + VR.
(4) Software Defined Radio.
(5) Software Defined Network.
(6) Digital Situational Awareness Map.
(7) Physical Test Monitoring System.

2017.07.27 දින සිට 29 දින දක්වා මහරගම තරුණ සේවා සභාවෙහි පැවති නව නිපැයුම් ප්‍රදර්ශණයෙහි තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ප්‍රදර්ශණ භාණ්ඩ ඉදිරිපත් කල අතර. එම ප්‍රදර්ශණ කුටි කෙරෙහි දැඩි මහජන ආකර්ශණයක් ඇතිවිය.

ඊට අමතරව තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ 7 වන සංවත්සරය සමරමින් කොස්ගම සර්වෝදය සුවසෙත ළමා සංවර්ධන මධ්‍යස්ථානය වෙත දානමය පිංකමක් සංවිධානය කරන ලදි. මේ සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂතුමන් ඇතුලු සියළුම නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගි වන ලදි. එමෙන්ම එම ළමා සංවර්ධන මධ්‍යස්ථානය තුල තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් ශ්‍රමදානයක් පවත්වන ලද අතර එම ළමුන්ගේ මූලික අවශ්‍යතා සඳහා අවශ්‍යව තිබූ නොයෙකුත් උපකරණ ඔවුන් වෙත පරිත්‍යාග කිරීමටද මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් පියවර ගන්නා ලදි.

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ 7 වන සංවත්සරයට සමගාමීව සියළු තොරතුරු තාක්ෂණ නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් නිළධාරී සුහද හමුවක් පැවැත්වූ අතර මෙය තොරතුරු තාක්ෂණ නිළධාරීන් අතර සහයෝගිතාවය වර්ධනයට සහ දැනුම බෙදා ගැනිමට ඉමහත් පිටුවහලක් විය.

යුද හමුදාව තුල තොරතුරු තාක්ෂණය තවදුරටත් ඔප්නැංවීමේ අදිටනින් යුතුව තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ නව අධ්‍යක්ෂ වශයෙන් බ්‍රිගේඩියර් ඩීජ්පීඑන් දෙමටන්පිටිය එන්ඩියු පීඑස්සි යන ජේෂ්ඨ නිළධාරී 2017 සැප්තැම්බර් මස 06 වන දින සුභ මොහොතින් සිය කාර්යාලයේ රාජකාරී භාර ගන්නා ලදි.



2017.07.27 දින සිට 29 දින දක්වා මහරගම තරුණ සේවා සභාවෙහි පැවති නව නිපැයුම් ප්‍රදර්ශණයෙහි තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ප්‍රදර්ශණ භාණ්ඩ ඉදිරිපත් කල අවස්ථාව









2017.07.27 දින සිට 29 දින දක්වා මහරගම තරුණ සේවා සභාවෙහි පැවති නව නිපැයුම් ප්‍රදර්ශණයෙහි තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශණ භාණ්ඩ



2017 සැප්තැම්බර් මස 06 වන දින නව අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ වශයෙන් බ්‍රිගේඩියර් ඩීඵ්පිඑන් දෙමටන්පිටිය එන්ඩියු පිඑස්සී යන ජේෂ්ඨ නිළධාරී තුමන් සිය කාර්යාලයේ රාජකාරී භාරගත් අයුරු



7 වන සංවත්සරය සමරමින් කොස්ගම සර්වෝදය සුවසෙත ළමා සංවර්ධන මධ්‍යස්ථානය වෙත දානමය පිංකමක් සිදු කිරීම



7 වන සංවත්සරයට සමගාමීව සියලූ තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් නිලධාරි සුහද හමුවක් පැවැත්වීම

## සංඥා බලසේනා මූලස්ථානය

සාමය උදාවීමත් සමඟින් රජය විසින් රටතුල ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ක්‍රියාදාමයේ කොටස් කරුවන් වශයෙන් වර්ථමානයේ මෙන්ම අනාගතයේදිද අප බලසේනා මූලස්ථානය පැවරෙන සංඥා රාජකාරීන් උපරිම අයුරින් ඉටු කිරීමට බැඳී සිටී.

පසුගිය කාල වකවානුව තුල රට තුල සිදු වූ අයහපත් කාලගුණික තත්වයන් හේතුවෙන් දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි කඳු නායයෑම්/ගංවතුර ගැලීම් හා අනෙකුත් ස්වාභාවික ව්‍යසනයන් සිදු වූ අවස්ථාවන්හි ආපදා රාජකාරීන් සඳහා යොදවා සිටි භට පිරිස් සඳහා සංඥා සම්බන්ධතාවය ලබාදීම හා දේශිය හා විදේශිය ප්‍රභූවරුන් හා හමුදා ප්‍රධානින් දිවයිනට පැමිණි විට පවත්වනු ලබන උත්සව හා සම්මන්ත්‍රණ සඳහා සංඥා අවශ්‍යතා ලබාදීම මෙම බලසේනා මූලස්ථානයේ අධීක්‍ෂණය යටතේ සිදුකරන ලදි.

අන්තර් සංඥා ඒකක පැසිපන්දු තරඟාවලිය සංඥා රෙජිමේන්තු පැසිපන්දු ක්‍රීඩාංගණයේදි 2016.05.22 වන දින මෙම බලසේනා මූලස්ථානය අධීක්‍ෂණය යටතේ ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි.



සංඥා බලසේනාධිපතිතුමගේ 9 ශ්‍රීලංසංබ ඒකක සංචාරය හා සම්මාන මුරය පරීක්‍ෂා කිරීම



2017.01.30 දින නව බලසේනා මේජර් වශයෙන් පත්වීම් ලැබූ මේජර් ඩීඑම්අයිඑස් බංඩාර ජේ‍යෂ්ඨ නිලධාරීතුමන් සුභ මොහොතින් වැඩ ආරම්භ කළ අවස්ථාව



මාලි රාජ්‍යයේ සාමසාධක කටයුතු සඳහා රැගෙන යාමට නියමිත සංඥා උපකරණ යුද්ධහමුදාධිපති තුමා නිරීක්‍ෂණය කල අවස්ථාව



සංඥා බලසේනා මූලස්ථානය විසින් සංවිධානය කරන ලද බෝධි පූජාමය පිංකම සඳහා බලසේනාධිපති තුමා සහභාගී වූ අවස්ථාව



The SIGNALLER

## සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය

74 වසරක පෞඩ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකා සංඥා බලකාය වේගයෙන් දියුණු වන ලෝකයේ නව සන්නිවේදන හා තාක්‍ෂණයන් සමග උරෙන් උර ගැටී ඉදිරියටම යමින් පවතින මොහොතක රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පහත සඳහන් වෙනස්කම් සිදුවන ලදි.

2016.10.15 වන දින සංඥා රෙජිමේන්තුවට ගෞරවයක් සහ අභිමානයක් වන සියළුම සංඥා නිලධාරීන් සහ සෙසු නිලයන්ගේ අධ්‍යාත්මික සිතුවිලි වර්ධනය කිරීම් වස් අභිනවයෙන් ඉදි කරන ලද සංඥා බලකා රෙජිමේන්තු පරිශ්‍රය තුල වූ පන්සල බලකාධිපති තුමාගේ සුරතින් විවෘත කරන ලදි.

2017.01.10 වන දින නව රෙජිමේන්තු විධායක අධිකාරී ලෙස මේජර් එච්එම්පීඅයියුබී හේරත් පීඑස්සී නිලධාරීතුමා වැඩ භාරගැනිම සිදු විය.

2017.01.16 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන සේනාවිධායක වන බ්‍රිගේඩියර් එන්පී අතුරන්තිලක ජේ‍යෂ්ඨ නිලධාරී තුමා එම තනතුරෙන් නික්මයන ලද අතර 2017.01.16 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස බ්‍රිගේඩියර් පීඑජේ පීරිස් ජේ‍යෂ්ඨ නිලධාරී තුමා පත්වන ලදි. 2017.01.16 වන දින නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස කටයුතු කල බ්‍රිගේඩියර් පීඑජේ පීරිස් ජේ‍යෂ්ඨ නිලධාරී තුමා එම තනතුර අත් හරින ලදි. 2017.01.16 දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස කර්නල් කේඒඩබ්එස් රත්නායක ජේ‍යෂ්ඨ නිලධාරී තුමා පත්විය.

2017.03.13 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානය තුල සිටින සියළුම සෙනින්ගේ අභිවෘද්ධිය සඳහා සංඥා බලකායේ සෙසුනිල මූළුතැන්ගෙය සංඥා බලකායේ බලකාධිපති තුමාගේ සුරතින් විවෘත විය.

වර්ෂ 2017 වන මාර්තු මස 23 වන දින සංඥා රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේදි නිලධාරී පුහුණු දිනය පැවැත්වූ අතර, ඒ සඳහා නිලධාරීන් 165 දෙනෙකු සහභාගි වන ලදි.

2017.04.15 වන දින ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති ලෙස කටයුතු කල මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ජේ‍යෂ්ඨ නිලධාරී තුමාගේ විශ්‍රාම ගැනීම වෙනුවෙන් ආචාර පෙළපාලියක් සහ රාත්‍රී භෝජනය සංග්‍රහයක් පවත්වනලදී.

2017.04.17 වන දින ශ්‍රී ලංකා සංඥා බලකායේ නව බලකාධිපති ලෙස මේජර් ජෙනරාල් බීඑච්එම්ඒ විජේසිංහ යූඑස්පී එන්ඩියූ පීඑස්සී ජේ‍යෂ්ඨ නිලධාරී තුමා වැඩභාර ගන්නා ලදී.

2017.08.31 වන දින සංඥා බලකායේ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නව සෙසුනිල භෝජනාගාරය සඳහා මුල් ගල තැබීම බලකාධිපති මේජර් ජෙනරාල් බීඑච්එම්ඒ විජේසිංහ යූඑස්පී එන්ඩියූ පීඑස්සී ජේ‍යෂ්ඨ නිළධාරී තුමා අතින් සිදු විය.

2017.09.04 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නව රෙසැමේ ලෙස බනි 1 එම්පීඑන් අමරසිරි පත්විය.



2016.10.15 වන දින සංඥා බලකා රෙජිමේන්තු පරිශ්‍රය තුල වූ පන්සල බලකාධිපති තුමාගේ සුරතින් විවෘත කරන ලදි.



2017.01.10 වන දින නව රෙජිමේන්තු විධායක අධිකාරී ලෙස මේජර් එච්එම්පීඅයියුබී හේරත් පීඑස්සී නිලධාරීතුමා වැඩ භාරගැනීම.



2017.01.16 දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස කර්නල් කේඑ්ඩබ්එස් රත්නායක ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමා වැඩ භාර ගැනීමේ මොහොත .



සංඥා බලකායේ සෙසුනිල මුළුතැන්ගෙය විවෘත කිරීම.



2017 වන මාර්තු මස 23 වන දින සංඥා රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේදී නිලධාරී පුහුණු දිනය පැවැත්වීම.



2017.04.15 වන දින ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති ලෙස කටයුතු කල මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පි යුඑස්පි එන්ඩියු පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමාගේ විශ්‍රාම ගැනීම.



2017.04.17 වන දින ශ්‍රී ලංකා සංඥා බලකායේ නව බලකාධිපති ලෙස මේජර් ජෙනරාල් බීඑච්එම්ජ් විජේසිංහ යුඑස්පි එන්ඩියු පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිළධාරී තුමා පත්වීම සහ වැඩභාර ගැනීම.



2017.09:04 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නව රෙසැමේ ලෙස බනි 1 එම්පිඑන් අමරසිරි ජ්‍යෝකොනොහි හට යෂ්ටිය ලබා දීම.





## 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

දෙවන ලෝක යුද්ධය තිව්‍ර වීමත් සමඟම බ්‍රිතාන්‍ය හමුදාවේ අවශ්‍යතා විවිධ අංශයන්ගෙන් වර්ධනය වූ අතර, 1939 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ බ්‍රිතාන්‍ය රාජකීය හමුදාවේ ක්‍රියාන්විත අවශ්‍යතා සැපයීම පිණිස සහ මිත්‍ර පාර්ශික හමුදාවන්ගේ සංඥා සම්බන්ධතා අවශ්‍යතා සැපයීම සඳහා සංඥා බළඇණ සක්‍රිය සේවයට කැඳවන ලදි. මෙම සංඥා බළඇණය රාජකීය හමුදාවේ ඉංජිනේරු බලකායට අනුයුක්තව රාජකාරීන් සිදුකල අතර, පසුව රාජකීය හමුදාවේ අවශ්‍යතාවයන් මත 1943 ඔක්තොම්බර් මස 19 වන දින අංක 9183 ගැසට් පත්‍රය මගින් 1 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය, සිලෝන් සංඥා බලකාය, නමින් පිහිටුවන ලදි. ඉන් අනතුරුව රටේ විවිධ ක්‍රියාන්විත /ක්‍රියාන්විත නොවන අවශ්‍යතාවයන් සඳහා සංඥා සම්බන්ධතා ලබා දීමට 1 වන සංඥා රෙජිමේන්තුව ක්‍රියාකල අතර, පනාගොඩ/ මඩකලපුව / මින්නේරිය / වැලිඔය සහ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයන්හි ස්ථානගතව සිට ත්‍රස්ථවාදයට එරෙහි අවසන් මානුෂීය මෙහෙයුමෙන් අනතුරුව වර්තමානයේ මුලතිව් දිස්ත්‍රික්කයේ වට්ටප්පලෙයි ප්‍රදේශයේ ස්ථානගතව සිටී. මෙම රෙජිමේන්තුව ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) සහ ඒ යටතේ ඇති සේනාංක මූලස්ථාන, බලසේනා මූලස්ථාන, ඒකක මෙන්ම අනෙකුත් යුධ හමුදා මූලස්ථාන/අණුබණ්ඩ සඳහා සංඥා සම්බන්ධතා ලබා දෙමින් රාජකාරී කටයුතු සිදුකරගෙන යනු ලබයි. 1 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය වසර 73 ක අභිමානවත් ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියයි.

ඒකකයේ 73 වන සංවත්සරයට සමගාමීව වාම් උත්සව මාලාවක් ආගමික වතාවත්වලට මුල් තැන දෙමින් සංවිධානය කරන ලද අතර, එහිදී ඒකකයේ ස්ථාපිත පන්සල වෙත ස්වාමීන් වහන්සේ නමක් වැඩමවා ඒකකයේ සේවය කොට දේශය වෙනුවෙන් තම ජීවිතය පූජා කල රණවිරුවන් හට පිං අනුමෝදනා කරමින් හා ඒකකයේ දැනට රාජකාරීන්හි නියුතු නිලධාරීන් හා සෙසුනිලයින් හට සෙත්පතා විශේෂ බෝධි පූජා පිංකමක්ද, වට්ටප්පලෙයි හින්දු කොවිලේ විශේෂ දේව මෙහෙයක්ද පවත්වන ලදි. තවද සංවත්සරයට සමගාමී ඒකකයේ අණදෙන නිලධාරී වෙත සම්මාන පෙළපාලියක් පිරිනමන ලද අතර, ඒකකයේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් සියලු නිළ සුහද හමුවක් හා දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදි. තවද ඒකකයේ බුදු මැදුර ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර කොත පැලදවීම සිදුකරන ලද අතර, බනි/සැර නිවස්නයේ සැරයන්වරුන් සඳහා ඉදිකරන ලද නේවාසික ගොඩනැගිල්ල විවෘත කිරීම සිදුකරන ලදි.

ශ්‍රී ලංකා සංඥා බලකායේ වර්තමාන සංඥා බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්ටී වෛද්‍යරත්න ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් එම තනතුරේ වැඩ භාර ගැනීමෙන් පසු මෙම ඒකක කඳවුරු සංචාරය 2016.11.02 දින සිදුකළ අතර, ඒ වෙනුවෙන් වැඩසටහන් මාලාවක් මෙම ඒකකය වෙතින් සංවිධානය කරන ලදි.

ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති ලෙස කටයුතු කරනු ලැබූ මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පි යූඑස්පි එන්ඩියු පිඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් යුධ හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීම නිමිත්තෙන් එතුමන්ගේ මෙම ඒකක කඳවුරු සංචාරය 2017.04.01 හා 02 යන දෙදින තුල සිදුවූ අතර, ඒ වෙනුවෙන් සම්මාන මුරයක් පිරිනැමීම, රුක් රෝපණය, හඩ පිරිස් ඇමතීම හා සියලු නිළ තේ පැන් සංග්‍රහයක් සංවිධානය කරන ලදි.

එම ජ්‍යෙෂ්ඨ නිලධාරී සංඥා බළකාධිපති තනතුරෙන් නික්ම යාමත් සමඟම නව සංඥා බලකාධිපති වශයෙන් වැඩ භාර ගන්නා ලද මේජර් ජෙනරාල් බීඑච්එම්ජ් විජේසිංහ යූඑස්පි එන්ඩියු පිඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ මෙම ඒකක කඳවුරු සංචාරය 2017.04.26 හා 27 යන දෙදින තුල සිදුවූ අතර, ඒ වෙනුවෙන් වැඩසටහන් මාලාවක් මෙම ඒකකය වෙතින් සංවිධානය කරන ලදි.

ඒකකයේ සුභසාධක කටයුතු නංවාලීම පිණිස අණදෙන නිලධාරී ලෙස රාජකාරී ඉටු කරනු ලබන ලුතිතන් කර්නල් එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පි පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ මග පෙන්වීම යටතේ පහත දක්වා ඇති ඉදිකිරීම් කටයුතු හා නව ව්‍යාපෘතින් රාශියක් ආරම්භ කරන ලදි.

අ. ඒකක බුදුමැදුර ප්‍රතිසංස්කරණය කර කොත පැලන්දවීම සිදුකිරීම.
ආ. බනි / සැරයන් නිවස්නයේ සැරයන්වරුන් සඳහා නව නේවාසිකාගාරයක් ඉදිකිරීම.
ඇ. ඒකකයේ දිර්ඝ කාලයක සිට අඩුපාඩුව ක්ව පැවති මූලස්ථාන බළඇණය සහ සංඥා සම්බන්ධතා බළඇණය සඳහා කාර්යා ගොඩනැගිල්ලක් නවතම යෙන් ඉදිවූ අතර, එම කාර්යාල ගොඩනැගිල්ලේ වැඩ කටයුතු කඩිනමින් නිමකර වත්මන් බලකාධිපති තුමන් විසින් 2017.04.27 දින මෙම ඒකකය තුල සිදු කරන ලද සංචාරයේදී එතුමන්ගේ සුරතින් විවෘත කිරීම.



නවතමයෙන් ඉදිකරන ලද සංඥා මධ්‍යස්ථානය හා ක්‍රියාන්විත මැදිරිය.



ආසේමු (මු) වෙතින් සංවිධානය කරන ලද නව නිපැයුම් ප්‍රදර්ශණය සඳහා ඉදිරිපත් කරන ලද GSM BASED HOME APPLIANCES AUTOMATIC CONTROL SYSTEM උපකරණය හඳුන්වාදීම.



2016.11.02 දින වර්තමාන සංඥා බලසේනාධිපති වන බ්‍රිගේඩියර් එම්ටී වෛද්‍යාරත්න යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ කඳවුරු සංචාරය.



2017.04.01 දින ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති ලෙස කටයුතු කරනු ලැබූ මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පි යූඑස්පි එන්ඩියු පීඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ කඳවුරු සංචාරය.



2017.04.26 දින නව සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් බීඑච්එම්ඒ විජේසිංහ යූඑස්පි එන්ඩියු පීඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ කඳවුරු සංචාරය.



නි/64856 මේජර් ඩබ්ඒර්එස් කරුණාරත්න යන ජ්‍යෙෂ්ඨ නිළධාරී ඒකක දෙවන අණදෙන නිළධාරී වශයෙන් වැඩ භාරගන්නා ලද අවස්ථාව.





## 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

1989 මාර්තු මස 09 වන දින සංඥා බලකා මෑණියන්ගේ කුසින් මෙළොව එළිය දුටු 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය මේ වන විට වසර 28 ක ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියනු ලබයි. දශක 03 ක් පමණ මාතෘ භූමිය වෙලාගෙන සිටි කුරිරු ත්‍රස්තවාදීන්ගේ හඬ නිහඬ කිරීමට සක්‍රියව දායක වෙමින් ත්‍රස්ට හඬ නිහඬ කිරීමෙන් පසු වසර අටක් ගතවන මේ මොහොතේ අප උපන් බිමට ඉටු කලාවූ සේවය වෙනුවෙන් නිහතමානිව සතුටට හා ආඩම්බරයට පත්වන්නෙමු.

මෙම වසර 28 පුරාවට මව් බිම බේරා ගැනීමේ මහා ක්‍රියාන්විතයන් සඳහා සංඥා රාජකාරී මෙන්ම පාබල රාජකාරීන් ඉටුකිරීමේදී රට ජාතිය වෙනුවෙන් තම ජිවිත පුජා කළ මෙම ඒකක විරුවන් මේ මොහොතේ හද පිරි ගෞරවයෙන් යුතුව සිහිපත් කරන්නෙමු.

අප ඒකකය 21 සේනාංකය යටතේ අනුරාධපුර රණසේවාපුර ස්ථානගතව රාජකාරන්හි නිරතව සිට 2007 සැප්තැම්බර් මස 18 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානය - යාපනය බලප්‍රදේශය වෙත පැමිණ වසර 10 කට ආසන්න කාලයක් ගතවන මේ මොහොතේ ආසේමු (යාපනය) වෙතින් පාලනය වන සේනාංක හා බලසේනාවන්හි සංඥා සම්බන්ධතා ගොඩනැගීමේ කාර්යයට දායකත්වය දෙමින් ඉතා උසස් මට්ටමින් ඒකකයේ ගෞරවය, කීර්තිනාමය ගොඩනගාගෙන ඇත.

එමෙන්ම ඒකකයට අත්‍යාවශ්‍යව තිබූ මුලුතැන්ගෙය , රෙසැමේ විවේකාගාරය සහ ඒකක ගරබ භූමිය අණදෙන නිලධාරී තුමා ඇතුළු සියළු නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ උත්සහය, උනන්දුව සහ මනා කැපවීම තුලින් සියළු වැඩ කටයුතු සාර්ථකව අවසන් කරමින් ඒකක අණදෙන නිළධාරී තුමන් අතින් විවෘත කරන ලදි.

ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) බළප්‍රදේශය තුල ඇති ඒකකයන්හි සංඥා රාජකාරීන් හි නිරතවීමට හැකි සෙබළුන් පිරිසක් බිහි කිරීමේ අරමුණින් විශේෂ පාබළ බණ්ඩ පුහුණු පාඨමාලවන් හි සංඥා අධියරයන් 04 ක් පමණ මෙම වසර තුලදී පවත්වා සංඥා දැනුමින් ඔවුන් පෝෂණය කරන ලදි.

එමෙන්ම 28 වන සංවත්සරයට සමගාමීව වැඩසටහන් මාලාවක් පවත්වන ලද අතර, බළඝණ අතර ක්‍රිකට්, එල්ලේ සහ අත්පන්දු තරගාවලියක් සංවිධානය කර ක්‍රිඩා හැකියාවන් ඔප් නැංවීම හා සාමුහිකව වැඩ කිරීම තුලින් ජයග්‍රහනය ලබා ගත හැකි බව ඒත්තු ගැන්වීමට කටයුතු කරන ලදි. තවද 2017.03.02 දින බෝධිපුජා පිංකමක් ඒකකය තුල සියළුම නිළයින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද අතර, 2017.03.03 දින මාවඩිපුරම් කෝවිල තුල හින්දු පුජාවක් ද පවත්වන ලදි.

තවද ඒකකයේ නිළධාරී/සෙසුනිළයින්ගේ වෘත්තිය දැනුම වර්ධනය හා විවිධ ඉදිරිපත් කිරීම් තුලින් නායකත්වය, ඒකකයේ එකිනෙකා අතර අන්‍යෝන්‍ය සහයෝගිතාව, කණ්ඩායම් හැගිම, සුහදශිලිත්වය වර්ධන කිරීමේ අරමුණින් යුතුව 2017 ජුලි මස 11 දින සංඥා බළඇණි පාඨමාලාව සංඥා පුහුණු පාසලෙහි පුර්ණ අධීක්‍ෂණය යටතේ 52 සේමු බළඇණි පුහුණු පාසල - විඩත්තපලෙයි හිදි ආරම්භ කර 2017 අගෝස්තු මස 14 වන දින දක්වා ඉතා සාර්ථකව පවත්වන ලදි.

අවසන් වශයෙන් 28 වන සංවත්සරය සැමරූ 3 වන සංඥා රෙජිමේන්තුව ඉදිරියටත් යුද හමුදාව තුල දිනෙන් දින දියුණුවට පවත්වේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.



නව අණදෙන නිලධාරී ලෙස ලුතිතන් කර්නල් වයිඑස්පී සුමනසිංහ ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 2017.01.18 දින රාජකාරී භාර ගැනීම වෙනුවෙන් ලබා දුන් සම්මාන මුරය



නි/64470 මේජර් එස්ඩබ්ලිව්බී ගමගෙදර යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 2017.01.25 දින සුභ මොහොතින් උප අණදෙන නිලධාරී තනතුරේ වැඩ භාර ගැනීම



28 වන සංවත්සරයට සමගාමීව පැවැත්වූ දමිළ කෝවිල් පූජාව



හිටපු සංඥා බලකාධිපති / ප්‍රධාන සංඥා නිළධාරී මේජර් ජෙනරාල් කේආර්පී රෝවෙල් ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ අවසන් ඒකක නිළ සංචාරය



ආසේමු (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඩියුකේ හෙට්ටිආරච්චි ආර්එස්පී යූඑස්පී එන්ඩියු පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක නිල සංචාරය



නව සංඥා බලකාධිපති / ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් බීඑච්එම්ඒ විජේසිංහ යූඑස්පී එන්ඩියු පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රථම මෙම ඒකක නිල සංචාරය





## 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

1991 වසරේ ජුනි මස 05 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන සන්නිවේදන ජාලයේ එක් උප ස්ථානයක් වූ ශ්‍රී ලංකා සංඥා බළකායේ 4 වන රෙජිමේන්තුව වසර 26 ක අභිමානවත් ඉතිහාසයක වර්තමානය සමග සහසම්බන්ධ කරන්නෙමු.

2017 වර්ෂය "තාක්ෂණයෙන් දියුණුව කරා" සමස්ථ ශ්‍රී ලංකා යුද හමුදාවේ අපේක්ෂාව මුල් කර ගනිමින් 4 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය ආගස්මු (වන්නි) බළප්‍රදේශයේ අණ හා පාලනයට අත්‍යාවශ්‍ය සේවාවක් වන සන්නිවේදන සේවාව සැපයීමේ භාරදූර රාජකාරිය නොපිරිහෙලා ඉටුකරමින් සිටී. බළප්‍රදේශයේ සේනාංක, බළසේනා, ඒකකයන් හි විශේෂ පාබල බණ්ඩ පුහුණුවීම්, බළඇණි පුහුණුවීම් හා වෙනත් ඒකකයන්හි සංඥා රාජකාරීයෙහි නියුතු සෙබළුන් හට අවශ්‍ය සංඥා රාජකාරී පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබාදෙන ලදි. එමෙන්ම එම මූලස්ථානයන් වෙත අවශ්‍ය සන්නිවේදන පහසුකම් සැපයීම සඳහා ලබාදී තිබූ උපකරණ නඩත්තුව හා ඒ හා සැබැඳි ලිපි ලේඛණ යාවත්කාලීන කිරීම සිදු කරන ලදි.

එමෙන්ම සංඥා බළකාය තුල වසර 30 කට අධික කාලසීමාවක් සේවය කල විශ්‍රාමික බළලත් නිළධාරී II ද්‍රෝණචිච් ගේ සේවා අත්දැකීම් තුලින් වර්ථමානයේ ගුවන් විදුලි ක්‍රියාකරුවන්ට අවශ්‍ය දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීමට දින 03 ක වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු කරන ලදි.

තවද ආවේණික වෘත්තින්ට පරිබාහිර ප්‍රායෝගික හැකියාවන් ඇතිසෙනින් යොදවාපවත්වාගෙන ගිය කැලිප්සෝ සංගීත කණ්ඩායම ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කර කැලිප්සෝ සංගීත හැකියාවට අමතරව "FLASH FOUR" නමින් දක්ෂ අධිරිද්ම සංගීත කණ්ඩායමක් බවටද ප්‍රවර්ධනය කරන ලදී.

එමෙන්ම තම ආවේණික වෘත්තින් තුළ මෙන්ම පරිබාහිරව ක්‍රීඩා ඇතුළු අනෙකුත් ක්ෂේත්‍ර තුල කැපී පෙනෙන දක්ෂතා දැක්වූ අයවළුන් ඇගයීමටත්, ඒ තුළින් ඒකකයේ සියළුම සෙනින් දිරිගැන්වීමටත් සේවය ඇගයීමේ සහතිකපත් ප්‍රදානය කිරීම උත්කර්ශවත් අයුරින් සංවිධානය කරන ලදි.

සංඥා බලකා සාමාජිකයින්ගේ ක්‍රීඩා හැකියාවන් වර්ධනය කිරීම හා ඔවුන් ජයග්‍රාහි මාවතකට යොමුකිරීමේ අරමුණින් ශ්‍රීලංකා සංඥා බලකා රෙජිමේන්තු ක්‍රිකට් කණ්ඩායම, මළල ක්‍රීඩා සංචිතය, පාපැදි කණ්ඩායම, පිහිනුම් සංචිතය හා තුන්ප්‍රයාම සංචිතයට අවශ්‍ය පුහුණුවීම් සඳහා ඇවැසි යටිතල පහසුකම් සැපයීම හා පුහුණු උපදෙස් ලබාදීම මෙම ඒකකය විසින් සිදුකරනු ලබයි. එතුලින් 2017 වර්ෂයේ තුන්ප්‍රයාම සංචිතය නියෝජනය කරන ක්‍රීඩකයින් අතුරින් ජාතික තලයේ තනි ඉසව් ප්‍රථමයා බිහිකිරීමට හැකි වීම හා 2017 වර්ෂයේ යුද හමුදා අන්තර් රෙජිමේන්තු ක්‍රිකට් තරගාවලියේදි සංඥා බලකා කණ්ඩායම අර්ධ අවසන් පූර්ව වටයට ගෙන ඒමට හැකි වීම විශේෂත්වයකි.

2017.06.05 වන දිනට යෙදී තිබූ මෙම ඒකක 26 වන සංවත්සරය නිමිත්තෙන් සර්ව ආගමික වතාවත් සිදුකර සර්ව රාත්‍රික පිරිත් සජ්ජායනාවක් පවත්වා මෙම ඒකකයේ සේවය කර දිවිපිදූ සහ ආබාධිත තත්වයට පත්ව සිටින සියළුම නිළයින්ටත් ඒකකයේ සේවයේ නියැලී සිටින මෙන්ම විශ්‍රාමික අයවළුන්ට හා සිවිල් සේවක මහතුන් වෙත පිංපෙත් අනුමෝදන් කර ආශිර්වාද ලබා දී පසුදින සාංඝික දානමය පිංකමක් පවත්වන ලදි.

මෙම ඒකක 26 සංවත්සර දිනයට සමගාමීව නිලධාරී සහ සෙසුනිලයින් 140 කට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් ලේ දන්දීමේ කඳවුරක් අනුරාධපුර ශික්ෂණ රෝහල සමග සම්බන්ධතාවයෙන් සිදු කරන ලදී.

මෙම ඒකක සංවත්සර දිනයට සමගාමීව සේවය කරන සියළු නිළධාරීන් නියෝජනය කරමින් පැවති නිළධාරී සුහද හමුවේදි 2016 වර්ෂයේදි විශ්‍රාම ගන්නා ලද කපිතන් එන්ටී නන්දසේන, ලුතිතන් එස්එස් ධර්මදාස, ලුතිතන් ජේඩී සිල්වා යන නිළධාරීන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ගේද සහභාගිත්වයෙන් අදාල නිළධාරීන්ගේ සේවය අගයමින් ඔවුනට ත්‍යාග හා සමරු තිළිණ ප්‍රදාන කරන ලදි.

2017 වර්ෂයේ සිංහල දමිළ අලුත් අවුරුද්ද නිමිති කරගනිමින් සේවයේ නියුතු නිලධාරීන්, සෙසුනිලයින්, සිවිල් සේවක මහතුන් හා පවුල්වල සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් ඉතා උත්කර්ෂවත් අලුත් අවුරුදු උළෙලක් ද පවත්වන්නට යෙදින.

ප්‍රෞඩත්වය වර්ධනය කිරීම සඳහා ඉදි කෙරෙනු ප්‍රධාන පිවිසුම් දොරටුව එවකට බළකාධිපති මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පි එන්ඩියූ පිඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිළධාරී තුමන් විසින් සුභ මොහොතින් විවෘත කරන ලදි. තවද අංග සම්පූර්ණ නිලධාරී නිවස්නයකට මුල්ගල තැබීමද එදිනම සිදුකිරීමට හැකිවිය.

එමෙන්ම ආයතනික අභිවෘද්ධිය උදෙසා ඉදි කෙරුනු ඉදිකිරම් හා නවීකරණයන් අතර ඒකකයට අවශ්‍ය කඳවුරු සම්මාන මුර පිඩිකාව, සිවිල් සේවක මහතුන්ගේ සනිපාරක්‍ෂක හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, ප්‍රධාන මුළුතැන්ගෙය හා බේකරිය නවීකරණ කිරීම, සෙසුනිළ හට නිවාස නවීකරණය, බනි/සැරයන් නිවස්න නවීකරණය, නිසි ප්‍රමිතියකින් යුත් ලේඛණාගාරයක් ඉදිකිරීම, සුභ සාධක වෙළඳසැල නවීකරණය, භූගත ජල පද්ධතිය හරහා සියළුම නිලයන් හට අවශ්‍ය පිරිසිදු පානීය ජල ව්‍යාපෘතිය ඇති කිරීම (RO plant) හා සංඥා ආධාරක බළඝණයට ලබාදුන් ව්‍යාපෘතියක් යටතේ කඳවුරු ආරක්‍ෂිත කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීම ප්‍රධාන තැනක් ගනී.

2016 සහ 2017 වර්ෂයන් තුල මෙම ඒකක සේවයේ නියුතු සියළු නිළයින් විෂය අනුබද්ධ පාඨමාලා සහ ක්‍රීඩා ඉසව්වන් වෙතින් සමස්ථ සංඥා බලකායටත් මෙම ඒකකයටත් කීර්තියක් අත්කර දීමට කටයුතු කොට තිබේ.



නව අණදෙන නිලධාරී ලෙස ලුතිතන් කර්නල් ඒකේඩී අධිකාරි යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 2016.08.02 දින රාජකාරී භාර ගැනීම වෙනුවෙන් ලබා දුන් සම්මාන මුරය



2016.11.08 දින වර්තමාන සංඥා බලසේනාධිපති වන බ්‍රිගේඩියර් එම්ටී වෛද්‍යරත්න යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ කඳවුරු සංචාරය.



2017.04.01 වන දින හිටපු සංඥා බලකාධිපති / ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් කේආර්පී රෝවෙල් ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පිඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරය



2017.04.25 වන දින නව සංඥා බළකාධිපති / ප්‍රධාන සංඥා නිළධාරී මේජර් ජෙනරාල් බීඑච්එම්ඒ විජේසිංහ යූඑස්පී එන්ඩියූ පිඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරීගේ මෙම ඒකක සංචාරය







සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් පීඑ්පේ පීරිස් යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරය .



2017.06.05 වන දින 26 වන සංවත්සරය වෙනුවෙන් අනුරාධපුර ශික්‍ෂණ රෝහල සමග සම්බන්ධතාවයෙන් ලේ දන්දීමේ සඳවුරක් පැවැත්වීම .



ඒකකයේ 26 වන සංවත්සරයට සමගාමීව ඒකකයේ අණදෙන නිලධාරී වෙත ලබා දුන් සම්මාන පෙළපාලිය



වෙනත් ඒකක සංඥා පාඨමාලාවේ අවසන් දේශනය ඒකක අණදෙන නිලධාරී විසින් සිදු කල අවස්ථාව



අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් පවත්වන ලද ක්‍රීඩාවන්වල ජයග්‍රාහකයින්ට ත්‍යාග ලබා දුන් අවස්ථාව

## 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

ශ්‍රී ලංකාද්වීපයේ ඒකියභාවය හා භෞමික අඛණ්ඩතාවය සුරකීමේ භාරදූර කර්තව්‍යය පෙරදැරිව එවකට රටෙහි පැවති යුද්ධමය වාතාවරණය හා යුද හමුදාවේ අවශ්‍යතාවය මත යුද හමුදාවේ නව බළඇණියක් වශයෙන් 1994 ජනවාරි මස 02 වන දින 5 වන සංඥා රෙජිමේන්තුව ස්ථාපනය කරන ලදි. ශ්‍රී ලංකා සංඥා බලකායේ පළමු ආධාරක බළඇණිය ලෙස ස්ථාපනය කරන ලද මෙම ඒකකය අනෙකුත් පාබළ ඒකකයන්ට නොදෙවෙනි වන ලෙස ත්‍රස්තවාදීන්ට දැඩි ප්‍රහාර එල්ල කරමින් උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි ක්‍රියාන්විත රාජකාරීන් දිවි හිමියෙන් ඉතා සාර්ථක අයුරින් ඉටුකරන ලද අතර එය සමස්ථ යුද හමුදාවේම ප්‍රශංසාවට හා ගෞරවයට ලක්වන ලදි. එමෙන්ම මෙම භාරදූර කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීමට තම ජීවිතය කැපකල ඒකකයේ වීරෝදාර රණවිරුවන් හා ආබාධිත තත්වයට පත්වී සිටින රණවිරුවන් අදටත් සිහිපත් කරනුයේ ඉමහත් ගෞරවයෙනි.

මානුෂිය මෙහෙයුම නිමාවෙන් පසු අවතැන් වූ ජනතාවගේ ජන ජීවිතය නගාසිටුවීම සඳහා උසස් මූලස්ථානයන්හි උපදෙස් පරිදි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කල මෙම ඒකකය එම කාර්‍යයන් ඉතා සාර්ථක ලෙස ඉටුකල අතර, එය එම ප්‍රදේශයන්හි වෙසෙන ජනතාවගේ ඉමහත් පැසසුමට ලක්විය. අනතුරුව මෙම ඒකකය එතෙක් සිදුකල පාබල රාජකාරී වලින් මිදී සංඥා බලකායට ආවේනික වූ සංඥා රාජකාරී ඉටුකිරීම සඳහා 2014 සැප්තැම්බර් මස 24 දින ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) බල ප්‍රදේශයට අයත් වේයන්ගොඩ මධ්‍යම පතුරම් සහ අචි ගබඩාවෙහි තාවකාලිකව ස්ථානගතවන ලදි. ඒකකයේ සෙබලුන් දීර්ඝකාලීනව ක්‍රියාන්විත රාජකාරීන්හි නිරතව සිටි බැවින් වත්මන් බළ ප්‍රදේශයේ සංඥා රාජකාරීන් ක්‍රමවත්ව ඉටුකිරීම සඳහා ඔවුන්ගේ වෘත්තිය දැනුම වර්ධනය කිරීමට සංඥා සංස්කරණ පාඨමාලාවක් පවත්වන ලදි. අනතුරුව 2014 දෙසැම්බර් මස 15 වන දින සිට ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ප්‍රදේශයේ සංඥා රාජකාරී ඉටුකිරීම භාරගන්නා ලදි.

අනතුරුව මෙම ඒකකය දිස්ත්‍රික්ක 9 ක් ආවරණය කරමින් ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ 14 සේනාංක මූලස්ථාන හා 58 සේනාංක මූලස්ථාන බල ප්‍රදේශයන්හි සංඥා රාජකාරී ඉටුකිරීම සඳහා මෙම ඒකකය සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රය තුල 2014 දෙසැම්බර් මස 22 දින ස්ථානගත විය. ඉතාමත් සාර්ථක අන්දමින් සංඥා රාජකාරී ඉටුකරමින් සිටින මෙම ඒකකයට එවකට සංඥා බළකාධිපති වශයෙන් කටයුතු කල මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමාගේ මගපෙන්වීම යටතේ ස්ථිර කඳවුරක් ඉදිකිරීම සඳහා වූ භූමියක් ඉංගිරිය මෙනේරිගම නැමති ප්‍රදේශයෙන් වෙන්කරවා ගත හැකිවිය. මේ වන විට එම භූමිය ඒකක අණදෙන නිලධාරී තුමාගේ අධීක්ෂණය යටතේ සියලුම නිළයින්ගේ පූර්ණ කැපවීම තුලින් කඳවුරක් බවට පත් කොට එම කඳවුරෙහි නවතමයෙන් ස්ථානගත කොට ඇත.

තවද මෙම ඒකකයට තම වෘත්තිමය ආවේනික සංඥා රාජකාරීන් ඉටුකරන අතරතුර රටෙහි ඇතිවන විවිධ හදිසි ස්වාභාවික ව්‍යසන අවස්ථාවන්හිදී ඒ වෙනුවෙන් දැඩි කාර්‍යභාරයක් ඉටු කිරීමට සිදුවේ. විශේෂයෙන්ම ගෙවීගිය වසර තුල මීතොටමුල්ල කුණු කන්ද නායයෑමෙන් සිදුවූ හදිසි අනතුරු තත්වය මෙන්ම දිවයින පුරා පැවැති අයහපත් කාළගුණික තත්වය මත ඇතිවූ ගංවතුර හා නායයෑම් තත්ව වලදී සහන සේවා කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ඇවැසි සංඥා සම්බන්ධතාවයන් මෙම ඒකක අණදෙන නිලධාරී තුමාගේ උපදෙස් පරිදි ඒකක භට පිරිස් යොදවා ඉතා සාර්ථක අන්දමින් ලබාදෙන ලදි. ඒ සඳහා ගුවන් විදුලි ප්‍රතිවිකාශන යන්ත්‍ර එම ප්‍රදේශ වල ස්ථාපිත කිරීම මගින් සහන සේවා සපයන කණ්ඩායම් සඳහා අවැසි සංඥා සම්බන්ධතාවය අඛණ්ඩව ලබාදිය හැකිවීම තුලින් උසස් මූලස්ථාන සමග සම්බන්ධතාවයන් නොකඩවා පවත්වා ගත හැකිවිය. එසේම දිවයින පුරා ඩෙංගු රෝගය සීඝ්‍රයෙන් පැතිරී යන කාලවකවානුවක ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) බලප්‍රදේශය තුල ඩෙංගු රෝගය මැඩලීම සඳහා විවිධ වැඩ සටහන් සඳහා ඒකක භටපිරිස් යොදවා ඒ සඳහා අවැසි සහයෝගය ලබාදෙන ලදි.

ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) බල ප්‍රදේශය තුල සංඥා රාජකාරී සිදුකරන අතරතුර අන්තර් ඒකක ක්‍රීඩා තරග වලදී කැපී පෙනෙන දක්ෂතාවයන් මගින් විශේෂ කුසලතා හා ඇගයීම් ලබා ගැනීමට මෙම ඒකක භට පිරිස් සමත් විය. එම ක්‍රීඩා අතරින් කබඩි, වෙරළ කබඩි, රගර්, එල්ලේ හා ස්පැක්ට්‍රැක්ටෝ යන ක්‍රීඩා වලදී අනෙකුත් සියලුම සංඥා ඒකක අභිබවා ශූරතාවය හිමිකර ගැනීමට මෙම ඒකක භට පිරිස් සමත්වූ අතර අනෙකුත් ක්‍රීඩා තරඟ වලදීද විශිෂ්ඨ දක්ෂතා දක්වා ඇත. එසේම 2017 වසරේ අන්තර් රෙජිමේන්තු රගර් තරඟාවලියේදී යුද හමුදා අනුශූරතාවය දිනාගත් සංඥා බලකා රගර් කණ්ඩායමේ ක්‍රීඩකයින් අතරින් ක්‍රීඩකයින් 9 දෙනෙකු මෙම ඒකකය වෙතින් නියෝජනය කිරීමද කැපී පෙනෙන ලදි. මෙම දක්ෂතා සමස්ථ සංඥා බලකායෙහිම ඇගයීමට පාත්‍රවිය.

මෙම ඒකකය ක්‍රියාන්විත රාජකාරීන් මෙන්ම තම වෘත්තිය සංඥා රාජකාරීන්ද ඉතාමත් සාර්ථක ලෙස ඉටුකරන ලද සුවිශේෂී ඒකකයක් වන අතර, ඉදිරියේදීද මෙම උදාර මෙහෙවර යුද හමුදාවේ හා සමස්ථ ලක්වාසි සැමගේ අභිවෘධිය සඳහා ඉටු කිරීමට ඒකකය වෙත ශක්තිය හා ධෛර්‍යය ලැබේවායි ප්‍රාර්ථනය කරමි.





මීතොටමුල්ල කුණු කන්ද නායයෑමෙන් සිදුවූ හදිසි තත්වය හා දිවයින පුරා පැවැති අයහපත් කාළගුණික තත්වය මත ඇතිවූ ගංවතුර හා නායයෑම් තත්ව වලදී සහන සේවා කටයුතු සිදු කිරීම හා සංඥා සම්බන්ධතාවයන් ලබා දීම



මෙම ඒකකය සඳහා කඳවුරක් ඉදිකර ගැනීමට ලබාදුන් ඉඩමේ වත්මන් තත්වය නව සංඥා බලකාධිපතිතුමා විසින් පරීක්ෂා කිරීම.




2017.07.25 දින මෙම ඒකක නවතමයෙන් ස්ථාපනය කරන ස්ථානයට ආසන්න පාසලක ළමුන් සඳහා පොත් සහ පාසැල් බෑග් ලබාදුන් අවස්ථාවක්.



2017.02.22 පැවති අන්තර් ඒකක රගර් අවසන් මහා තරගයෙන් ජයග්‍රාහණය කල අවස්ථාව.



2017.06.17 පැවති අන්තර් ඒකක එල්ලේ අවසන් මහා තරගයෙන් ජයග්‍රාහණය කල අවස්ථාව.



2017.07.22 දින පැවති සැපැක් ටැක්වෝ (SEPAK TAKRAW) ක්‍රීඩාව යුද හමුදාවට හඳුන්වාදිමෙන් පසු පළමු වරට සංඥා ඒකක අතර පැවති තරගාවලියෙන් මෙම ඒකකය ජයග්‍රාහන්ය කල අවස්ථාව.



2017 වෙසක් කලාපය වෙනුවෙන් මෙම ඒකකය වෙතින් නිර්මාණය කරන ලද පහන් කූඩුව.





## 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

මව් දෙරණෙහි වසර 30 කට අධික කාල සීමාවක් තුල පැවති යුධමය වාතාවරණයෙන් පසු උදාවී ඇති සාමකාමී වටපිටාව මධ්‍යයේ 21 වන වියට පා තැබූ සංඥා බලකායේ 2 වන ආධාරක බළඇණිය ලෙස 1997.01.10 වන දින ආරම්භ කරනු ලැබූ 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය 2014.06.16 වන දින ආධාරක බළඇණි රාජකාරිවලින් මිදී තොරතුරු තාක්‍ෂණ රාජකාරීන් වෙත අනුවර්ථනය වී මේ වන විට එම රාජකාරීන් මනාව ඉටු කරමින් සිටී. තම ගෙවී ගිය කාල පරාසයෙහි අභිනාවර්ජනය ද සිග්නලර් සඟරාවේ පසුගිය කළාපය තුලින් එළි දැක්වූ බැවින් ගෙවී ගිය පසුගිය වසර තුල සිදුවූ විශේෂිත සිදුවීම් පමණක් මෙසේ සනිටුහන් වේ.

වත්මන් රාජකාරීන් යටතේ මෙම ඒකකය ආසේමු (යාපනය) බළප්‍රදේශයේ යාපනය නගර මධ්‍යයේ ඉතා අලංකාර භූමි ප්‍රදේශයක අභිනවයෙන් ඉදිකරන ලද කඳවුරු භූමියක ස්ථාන ගතව ඇති අතර, මෙම ඒකක අණදෙන නිළධාරී වන ලුතිනන් කර්නල් එච්ජ්අයියු හේවාආරච්චි යන ජ්‍යේෂ්ඨ නිළධාරීගේ අණදීම යටතේ ආසේමු යාපනය, ආසේමු වන්නි, ආසේමු කිලිනොච්චි හා ආසේමු මුලතිව් යන ආරක්‍ෂක සේනා මූලස්ථානයන්හි තොරතුරු තාක්‍ෂණ රාජකාරී ආවරණය කරමින්ද උසස් මූලස්ථානයන් වෙතින් පැවරෙන රාජකාරීන් හා වගකිම්ද ඉතා උසස් අන්දමින් ඉටුකරමින්ද යාපනය ආශ්‍රිතව වෙසෙන සිවිල් වැසියන්ගේද නොමද ප්‍රසාදයට ලක් වෙමින් රාජකාරී ඉටුක්රනු ලබයි.

එමෙන්ම ආධාරක බළඇණියක් වශයෙන් 1997.01.10 දින ආරම්භ කල මෙම ඒකක 20 වන සංවත්සරය 2017.01.10 දිනට යෙදී තිබූ අතර, එයට සමගාමීව පළමු අදියර වශයෙන් මෙම ඒකකය යටතේ ක්‍රියාන්විත රාජකාරියෙහි යෙදී සිට තම ජීවිත පුදකල රණවිරුවන් හට නිවන් සුව ප්‍රාර්ථනය කිරීම සඳහාත් තුවාල ලබා ආබාධිත තත්වයට පත්ව සිටින රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් යාපනය ශ්‍රී නාග විහාරස්ථානයේදී ආගමික වතාවත් සිදු කරන ලදි. අනතුරුව දෙවන අදියර යටතේ 2014.06.16 වන දින තොරතුරු තාක්‍ෂණ ඒකකයක් වශයෙන් ආරම්භ කල මෙම ඒකකය 2017.06.16 වන දිනට යෙදී ඇති 03 වන සංවත්සරයට සමගාමීව 2017.06.10 වන දින ගරුතර මහා සංඝරත්නය වැඩම කරවා සර්ව රාත්‍රික පිරිත් සජ්ජායනයක් සිදුකර සංඝගත දක්‍ෂිණාවක්ද පවත්වන ලදි. එමෙන්ම 2017.06.16 වන දින අණදෙන නිළධාරී තුමන් හට සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනමා එදිනම සියළු නිළ දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදි. තවද 2017.06.17 දින මහත් උත්කර්ෂවත් අන්දමින් සියළු නිළ සුහද හමුවක්ද පවත්වා ඉන් පසු 2017.06.20 වන දින සන්ධ්‍යාවේදී බනි/සැරයන් නිවස්න සාදය මෙන්ම 2017.06.24 වන දින සන්ධ්‍යාවේදී නිළධාරී නිවස්නයේ සුහද හමුවක්ද පවත්වන ලදි.

ඒකකය තුළ රාජකාරී කරනු ලබන නිළධාරී/සෙසුනිළයින්ගේ අධ්‍යාත්මික වර්ධනය උදෙසා සියළු දෙනාගේම ආගමික වතාවත් වෙනුවෙන් ඉදිකර තිබූ බුදු මැදුරෙහි අළුත්වැඩියා කටයුත්තක් වශයෙන් තැන්පත්කර ඇති පිළිම වහන්සේගේ රන් ආලේපනය කිරීමෙන් පසු එය නිරාවරණය කිරීම සහ එයට සමගාමීව 2017.01.12 දින බෝධීන්වහන්සේ නමක් වැඩමවා රෝපණය කිරීමද සිදුකරන ලදි.

ආසේමු (යාපනය) බළප්‍රදේශය තුල පවත්වනු ලැබූ සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය, වෙසක් පුන් පොහොය දින නිමිති කොට ගෙන පැවති වෙසක් උත්සවය වැනි උත්සව මාලාවන් වෙනුවෙන් මෙම ඒකක භට පිරිස්හි නොමද දායකත්වය ලබා දෙන ලදි. එමෙන්ම යාපනය ප්‍රදේශයේ රාජකාරී නියුතු යුද හමුදා නිළධාරී/සෙසුනිළයින්ගේ නිර්මාණ ඇගයිම සහ හඳුන්වාදිම යටතේ 2017.06.17 සහ 18 යන දෙදින තුල යාපනය වීරසිංහම් ශාලාවේදී පැවති නව නිපයුම් ප්‍රදර්ශණය සඳහා මෙම ඒකකය වෙතින් සෙ/280988 ලාන්ස් කෝප්‍රල් ගුණතිලක එච්එම්ඩබ්පීපීඑස් යන කොනොනි විසින් ඒකක නිළධාරී/සෙසුනිළ ශ්‍රමදායකත්වයෙන් යුතුව නිර්මාණය කරනු ලැබූ කාර්‍යයක්‍ෂම රොටි සැකසීමේ උපකරණය ඉහත සඳහන් ප්‍රදර්ශණය සඳහා ඉදිරිපත් කිරීම තුළින් උසස් මූලස්ථාන වෙතින් ඇගයිමට ලක්වන ලදි.

තවද, මෙම ඒකක නිළධාරී හා සෙසු නිළයින්ගේ ක්‍රීඩා කුසලතාවයන්ද මේවන විට උසස් මට්ටමක පවතින අතර, 2017 සංඥා රෙජිමේන්තු අන්තර් ඒකක වෙඩි තැබීම් තරගාවලියේ ශූරතාවය නොකඩවා 04 වන වරටත් දිනා ගැනිම, 2017 සංඥා රෙජිමේන්තු අන්තර් ඒකක ගෘහස්ථ ඔරු පැදිමේ තරඟාවලියේදී මෙම ඒකකය වෙතින් තරඟ කරන ලද සෙ/285115 සංසෙ දිසානායක යුඑල්ඩීඑස් විසින් රන් පදක්කම හිමිකර ගැනිම හා 2017 සංඥා රෙජිමේන්තු අන්තර් ඒකක වොලි කබඩි සහ කබඩි තරඟාවලි අනු ශූරතාවය දිනා ගැනිම වැනි ජයග්‍රහණ රැසක් හිමිකර ගෙන ඇත. එමෙන් සංඥා බලකායේ උපදෙස් අනුව යුද හමුදා

ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟ පෙන්වීම යටතේ නව ක්‍රීඩාවක් වන සේපක්ටැක්රෝ (Sepak Takraw) ක්‍රීඩාව සංඥා බලකාය වෙත හඳුන්වාදීම සඳහා ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් උපදේශක සහය ඇතිව 2017.03.25 සහ 26 යන දෙදින තුල එම ක්‍රීඩාවෙහි පුහුණු වැඩමුළු මෙම ඒකකය වෙතින් පවත්වන ලදි.

එමෙන්ම ඒකක සෙබළුන්ගේ නිළ උසස් කිරීම් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් නිළ උසස් කිරීමේ පාඨමාලාවන්ද ඒකකය තුලදීම පවත්වනු ලැබූ අතර, අනෙකුත් සංඥා ඒකකයන් වෙතින් හා සංඥා පාසැල වෙතින් පවත්වනු ලබන වෘත්තිමය හා නිළ උසස් කිරීමේ පාඨමාලාවන් සඳහා වැඩි වශයෙන් මෙම ඒකක සෙබළුන් රපෝර්තු කරවීම තුලින් ඔවුන්ගේ වෘත්තිය දැනුම වැඩිදියුණු කිරීමටත් ඉදිරි හමුදා දිවිය සාර්ථක කර ගැනීමටත් කටයුතු කරමින් පවතින අතර ඒකක නිළධාරීන්/සෙසුනිළයින්ගේ සාමූහිකත්වය මෙන්ම දැණුම වර්ධනය කිරීම උදෙසා සංඥා පුහුණු පාසැල අධීක්ෂණය යටතේ මහබෝරියතැන්න පුහුණු පාසලේදි 2016 වර්ෂය තුලදි බළඇණි පුහුණු පාඨමාලාවක් සිදුකරන ලදි. තවද අනෙකුත් සුභසාධක කටයුතු පිළිබඳව සොයා බලා ක්‍රියා කිරීම සෙබළුන්ගේ චිත්ත ධෛර්යය උසස් අන්දමින් පවත්වාගෙන යාමට පිටුවහලක් වී ඇති අතර එමගින් ඔවුන් වෙත පැවරෙන රාජකාරීන් කැපවීමෙන් හා වගකීමෙන් මෙන්ම උනන්දුවෙන් ඉටුකිරීම මේවන විට මෙම ඒකකය ලබා ඇති සාර්ථකත්වයට බලපා ඇති ප්‍රධාන කරුණකි.

මෙම ඒකකය 2014.06.16 දින තොරතුරු තාක්ෂණ ඒකකයක් වශයෙන් ප්‍රතිව්‍යුහගතවීමෙන් පසු එම රාජකාරී ඉටුකිරීමේ පහසුව සඳහා පරිගණක පාඨමාලා වෙනුවෙන් සෙනින් වැඩි පිරිසක් රාතොතාපුපා කොකාවිල්, අනුරාධපුරය සහ කුරුවිට යන පුහුණු ආයතන වෙත යොමු කරවා අවශ්‍ය දැණුම ලබාදීමට කටයුතු කර ඇත.

එමෙන්ම මෙම ඒකක බලප්‍රදේශය තුල රාජකාරී නියුතු වෙනත් ඒකක සෙනින්ගේ පරිගණක දැණුම වර්ධනය කිරීම වෙනුවෙන් මෙම ඒකකය වෙතින් පරිගණක පාඨමාලාවන් සිදුකරනු ලබන අතර නවතමයෙන් ස්ථාපනය කරනු ලැබූ පරිගණක වැඩපල තුළින් මෙම ඒකක බළප්‍රදේශය තුළ පරිගණක අළුත්වැඩියා කිරීම සහ පරිගණක ජාල කටයුතු විදිමත්ව හා ක්‍රමවත් අයුරින් සිදුකරනු ලබයි.

දැනට ඒකකය සංඥා බලකා පවුලට එක්වී වසර 20 කට වැඩි කාලයක් ඉක්මවා ගොස් ඇති අතර, එම කාලපරාසය තුල ඒකකයේ සාර්ථකත්වයට අණදෙන නිළධාරිවරුන් 16 දෙනකු නායකත්වය ලබා දී ඇති අතර, වත්මන් අණදෙන නිලධාරීතුමන් නායකත්වය හා මගපෙන්වීම යටතේ ඒකකයේ පාලන කටයුතු හා සෙබළුන්ගේ සියලුම සුභසාධක කටයුතු ඉතා උසස් මට්ටමින් ඉටු කිරීමට හැකියාව ලැබී ඇත. එබැවින් එය ඒකකයේ ඉදිරි ගමන් මගෙහි සාර්ථකත්වයට ඉමහත් පිටුවහලකි.

අවසන් වශයෙන් 20 වන කඩඉම පසුකරමින් 21 වන වියට සාර්ථකව පියමනින 6 වන රෙපිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ආරම්භයේ සිට මේ දක්වා පැමිණි ගමන් මගෙහි සාර්ථකත්වයට දායක වෙමින් දිවිහිමියෙන් හා කාය දානයෙන් රාජකාරී කල සියළුම නිළධාරී/සෙසුනිළයින් හටද, දැනට රාජකාරීයේ යෙදි සිටින සියළුම නිළධාරී/සෙසුනිළයින්ද ඉතාමත් භක්ති ප්‍රණාමයෙන් යුතුව සිහිපත් කරමින් මෙවන් වූ මෙහෙවරක් ඉටුකල 6 වන රෙපිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකා නාමය සංඥා බලකාය තුල පමණක් නොව සමස්ථ ශ්‍රී ලංකා යුද හමුදාව තුල දීප්තිමත් ඒකකයක් ලෙස වැජඹෙන්නට ප්‍රාර්ථනා එක් කරමින් පසුගිය වසරෙහි අභිතාවර්ජනය මෙසේ සමාප්ත කරන්නෙමු.



2017.04.02 දින හිටපු සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පී එන්ඩියූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමාගේ කඳවුරු සංචාරයේදී අණදෙන නිලධාරී තුමා විසින් සමරු ඵලකයක් පිරිනැමීම







2017.04.26 දින අභිනව සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් ඩීඩබ්ඩබ්එම්ජේ විජේසිංහ යූඑස්පී එන්ඩියූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමා කඳවුරු නිරීක්ෂණය කරන ලද අවස්ථාව.



2017.05.16 වන දින මෙම ඒකකයට අයත් බළප්‍රදේශයෙහි වෙනත් ඒකක සෙනීන් සඳහා ආරම්භ කරන ලද පරිගණක පාඨමාලාවට සෙනීන් සහභාගීවූ අවස්ථාව.



3 වන සංවත්සරයට සමගාමීව 2017.06.10 වන දින ගරුතර මහා සංඝරත්නය වැඩම කරවා සර්ව රාත්‍රික පිරිත් සජ්ජායනයක් සිදුකර සංඝගත දක්ෂිණාවක් පැවැත්වූ අවස්ථාව



ඒකක 03වන සංවත්සරයට වෙනුවෙන් 2017.06.16 දින පවත්වන ලද පෙළපාලිය අණදෙන නිළධාරීතුමන් විසින් නිරීක්ෂණය කිරීමේ අවස්ථාව.



2016 වර්ෂයේ මෙම ඒකක නිළධාරී/සෙසුනිලයිනගේ සාමූහිකත්වය වර්ධණය කිරීම සඳහා මහබෝරියතැන්න පුහුණු පාසලේ පවත්වන ලද බළඇණි පුහුණු පාඨමාලාවෙහි ආරම්භක දේශනය අණදෙන නිළධාරී තුමන් විසින් පැවැත්වීම සහ එම පාඨමාලාවෙහි සෙනීන් වෙහෙසකර පාගමනක යෙදෙන අවස්ථාව.

## 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

වර්ෂ 2008 ක් වු පෙබරවාරි මස 08 වන දින නිළධාරින් 18 ක් සහ සෙසුනිළයින් 525 කගෙන් සමන්විත ආධාරක බළඇණියක් වශයෙන් රෙජිමේන්තු මුලස්ථානය පනාගොඩහි ආරම්භ කරන ලද 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය උතුරු මානුෂික මෙහෙයුම සඳහා සක්‍රිය ලෙසින් දායක වෙමින් ත්‍රස්තවාදය මෙරටින් මුළුමනින්ම තුරන් කිරීමේ අනුපමේය කාර්ය භාරයේ කොටස්කරුවන් බවට පත්වීමෙන් අනතුරුව 2013 මාර්තු 10 වන දින සිට වෘත්තිය සංඥා රෙජිමේන්තුවක් වශයෙන් ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) මුලික කොටගෙන දියතලාව ප්‍රදේශයේ ස්ථානගත වෙමින් ආසේමු (බටහිර) සහ ආසේමු (මධ්‍යම) බළප්‍රදේශයන්හි සංඥා රාජකාරීන් ඉටු කිරීමේ භාරදූර වගකිම භාර ගන්නා ලදි.

දිස්ත්‍රික්ක 15 ක් ආවරණය කරමින් වසරකට අධික කාලයක් ආරක්‍ෂක සේනා මුලස්ථානය බළප්‍රදේශයන් දෙකක සංඥා රාජකාරීන් සාර්ථකව ඉටු කිරීමෙන් අනතුරුව 5 වන සංඥා රෙජිමේන්තුව විසින් ආරක්‍ෂක සේනා මුලස්ථානය (බටහිර) බළප්‍රදේශයේ සංඥා රාජකාරීන් ඉටු කිරීම ආරම්භ කිරීමෙන් පසු වර්ෂ 2014 දෙසැම්බර් මස 22 වන දින සිට මේ දක්වා ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) හි දිස්ත්‍රික්ක 6 ආවරණය වන පරිදි සංඥා රාජකාරීන් ඉටු කරනු ලබයි.

දියතලාව මැණික්කන්ද ප්‍රදේශයේ දර්ශනිය භූමි භාගයක් තුල 2014.12.26 දින ස්ථානගත කඳවුර ඉතාමත් කෙටි සම්පත් ප්‍රමාණයකින් හා සිමිත ප්‍රතිපාදන තුලින් ඉතාමත් අලංකාර ලෙස තව දුරටත් ඉදිවෙමින් පවති.

ඒකක 9 වන සංවත්සරය 2017.02.08 වන දිනට යෙදි තිබුණු අතර, ඊට සමගාමිව ඒකක අභිමානය විදහා දක්වන්නාවු අති උත්කර්ශවත් වැඩසටහන් මාලාවක් මෙම ඒකක හිටපු අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් පීඑස් ෆොන්සේකා යූඑස්පි පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිළධාරිතුමන්ගේ මගපෙන්විම යටතේ පවත්වන ලදි.

ඒ අනුව, 2017.02.04 දින රණබිමේදි රට දැය වෙනුවෙන් දිවිපිදු/ආබාධිත තත්වයට පත් හා දැනට සේවයේ නියුතු 7 ශ්‍රිලංසංබ රණවිරුවන් හට සහ ඔවුන්ගේ පවුල්වල ඥාතින්ට සෙත් පතා පවත්වන ලද සර්ව රාත්‍රික පරිත්‍රාන ධර්මදේශනාමය පිංකම හා 2017.02.05 වන දින මහා සංඝයා වහන්සේලා දහනමක් සඳහා හිල් දානය පූජා කිරීම ඒකකයේ අණදෙන නිළධාරි ඇතුලු සියලු නිළයින්ගේ බැතිබර දායකත්වයෙන් යුතුව කඳවුරු භූමිය තුල සිදුකරන ලදි. 2017.02.08 වන දින ඒකක අණදෙන නිළධාරි තුමන් වෙත කඳවුරු මුරයක් හා අභිමානවත් සම්මාන පෙළපාලියක් පිරිනමන ලදි.

ඉන් අනතුරුව 2017.02.08 වන දින සාම්ප්‍රදායික සියලු නිළ දිවා භෝජන සංග්‍රහය පැවැත්විමෙන් අනතුරුව 2017.02.09 වන දින සියළු නිළ සහභාගිත්වයෙන් කතරගම පූජා භූමියේ ආශිර්වාද පූජාවක් පවත්වන ලදි. 2017.02.11 දින බනි/සැර නිවස්න සාදය පවත්වන ලද අතර, 2017.02.14 දින ඒකකයට අණදුන් අණදෙන නිළධාරින්, රාජකාරි කරනු ලැබූ හා රාජකාරි කරනු ලබන සියලුම නිළධාරින්ගේ සහභාගිත්වයෙන් පැවති නිළධාරි නිවස්න සාදයෙන් අනතුරුව සංවත්සරයේ වැඩකටයුතු සාර්ථකව නිමාවට පත්විය.

වසර දෙකක කාලසිමාවක් තම නිකැලැල් සේවය 7 වන සංඥා රෙජිමේන්තුවට ලබාදිමෙන් පසු එහි අණදෙන නිලධාරි වු ලුතිතන් කර්නල් පීඑස් ෆොන්සේකා යූඑස්පි ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් 2017.02.18 දින අණදෙන නිලධාරි තනතුරෙන් නික්ම ගිය අතර, ඒ සදහා ඉතා අභිමානවත් කදවුරු මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනමන ලදි.

2017.02.22 වන දින 7 ශ්‍රිලංසංබ නව අණදෙන නිලධාරි තුමාගේ සම්ප්‍රාප්තිය උත්කර්ශවත් අයුරින් සිදුවු අතර, සුභ මොහොතින් ලුතිතන් කර්නල් එච්ඩිජේපි වීරතුංග යන ජ්‍යෂ්ඨ නිළධාරි තුමන් අණදෙන නිලධාරි තනතුරේ වැඩ භාරගන්නා ලදි.

2017.03.29 දින 7 වන සංඥා රෙජිමේන්තුව විසින් සංවිධානය කරන ලද අන්තර් ඒකක රයිෆල් වෙඩිතැබීමේ තරගය ඉතා ක්‍රමවත් ලෙස දියතලාව වෙඩි පිටියේදි පවත්වන ලදි. එහිදි 7 වන සංඥා රෙජිමේන්තුව දෙවන ස්ථානය ලබාගන්නා ලදි.

ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) හි 7 ශ්‍රිලංසංබ යන නාමය කිර්තිමත්ව හා අභිමානය නොසැලෙන පරිදි මෙම වසරේදිද ආසේමු (මධ්‍යම) වෙතින් පවත්වනු ලැබූ සිංහල හින්දු අලුත් අවුරුදු උළෙලේ අනිකුත් ඒකකයන් අභිබවමින් හොදම නිර්මාණය ලෙස ඒකක සෙනින්ගේ දයකත්වයෙන් නිමවු "ගැමි ගෙදර" ප්‍රථම ස්ථානය හිමිකර ගත් අතර, එම උළෙලේ වෙනත් තරග ඉසව්වන්ගෙන්ද ජයග්‍රහන රැසක් හිමිකර ගැනිමටද 7 ශ්‍රිලංසංබ ඒකක සෙනින් සමත් විය.



මේජර් ජෙනරල් බීඑච්එම්ඒ විජේසිංහ යූඑස්පි එන්ඩියු පිඑස්සි ජ්‍යෂ්ඨ නිලධාරිතුමන් නව සංඥා බලකාධිපති තනතුරෙහි වැඩ භාරගැනිමෙන් පසු සිදුකරන ලද සියලු ඒකක කඳවුරු සංචාරයන්ට සමගාමිව 2017.04.28 වන දින මෙම කඳවුර නිරීක්‍ෂණය කරන ලදි.

තවද, ආසේමු(මධ්‍යම) වෙතින් සංවිධානය කල වෙසක් කලාපයේ ත්‍රිවිධ හමුදා පහන්කුඩු අතුරින් මෙම ඒකක පහන් කුඩුව දෙවන ස්ථානය හිමිකර ගැනිමද ඒකක සෙනින්ගේ එකමුතුවේ අගය විදහාපායි.

ආසේමු (මධ්‍යම) මග පෙන්විම යටතේ සෑම මසකම පෙහෝ දිනට සමගාමිව බෝධිපූජාමය පිංකම දියතලාව බෝධිකන්ද බෝ මලුවේදි පැවැත්වේ. ඒ අනුව පොසොන් පොහොය නිමිත්තෙන් පැවැත්වූ බෝධි පූජාව සම්පූර්ණ සංවිධාන කටයුතු ඉතා උත්කර්ෂවත් අයුරින් සියලු දෙනාගේ දැහැමි සිත් පහන් වන ආකාරයෙන් පැවැත්විමට 7 වන සංඥා රෙජිමේන්තුව සමත් විය.

එමෙන්ම සිවිල් පිවිතයට ඇතිවන හදිසි අපදාවලට ඉතාමත් කාර්යක්‍ෂමව පිලිතුරු ලබාදිමට 7 වන සංඥා රෙජිමේන්තුව නිතැතින් සැදි පැහැදි සිටි. 2017/06/06 වන දින පුනාගල ලියන්වල වතුයායේ අක්කර 13 ක ප්‍රදේශයක ව්‍යාප්තව පැවැති ලැව් ගිනි නිවීම සඳහා 7 වන සංඥා බළකායේ 01 x 15 හඩ පිරිසක් තම පිවිත අවදානම නොතකා සහභාගි වී ඉතාමත් කඩිනමින් එය මැඩ පැවැත්වමට සමත් විය.

තවද, ගතවු වසරක කාල පරිච්ජේදය තුල සරඹ උපදේශක පාඨමාලාව සඳහා ජ්‍යකොනොහින් 02 ක්, ලිපිකරු පාඨමාලාව සඳහා සෙනින් 01 ක්, රියදුරු පාඨමාලාව සඳහා සෙනින් 03 ක්, මුලික පරිඝණක පාඨමාලාව සඳහා සෙනින් 04 දෙනෙකු පසුගිය වර්ෂය තුල දේශිය පාඨමාලා සඳහා සහභාගිව ඇත.

මෙම වර්ෂයේද ෆොක්ස්හිල් සුපර්ක්‍රෝස් 2017 සහ ශ්‍රිලංයුහවිපි කෙනි විසිර යාමේ පෙලපාලි ආසේමු (මධ්‍යම) බළ ප්‍රදේශය බලප්‍රදේශය තුල ස්ථාපිත සියලූ සේමු/බසේමු/ඒකක/පුහුණු පාසල් හා ආයතනයන්හි පවත්වනු උත්සව පෙලපාලි හා සම්මන්ත්‍රණයන් ආවරණය කිරීම සඳහා අවැසි ජන ඇමතුම් රාජකාරීන් ඇතුල් සියලූම සංඥා රාජකාරීන් මෙම ඒකකය වෙතින් සාර්ථකව ඉටු කරන ලදි.



7 ශ්‍රිලංසංබ රණවිරුවන් හට සහ ඔවුන්ගේ පවුල්වල ඥාතින්ට සෙත් පතා පවත්වන ලද සර්ව රාත්‍රික පරිතාන ධර්මදේශනාමය පිංකම හා මහා සංඝයා වහන්සේලා දසනමක් සඳහා කරන ලද හීල් දානමය පුණ්‍යදය කර්මය



අණදෙන නිලධාරිතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්වූ බනි/සැරයන් නිවස්න සාදය



නි/62054 ලුතිතන් කර්නල් පිඑස් ෆොන්සේකා යූඑස්පි යන ජ්‍යෂ්ඨ නිළධාරි තුමන් නික්ම යාම වෙනුවෙන් පිරිනමන ලද සම්මාන පෙළපාලිය

විහාරස්ථානයේදී සිදුකළ බෝධි පූජා පිංකමකින් ආරම්භ විණි. ඒකකයෙහි භෞතික මෙන්ම ගුණාත්මක සංවර්ධනයන් උදෙසා වූ සිය අරමුණෙහි කාලීන වූ ඉලක්කයන් සපුරා ගනිමින් ඒකකය ජයග්‍රහණය කරා මෙහෙයවන අණදෙණ නිළධාරිතුමන් වෙත පිරිනැමුණු සම්මාන පෙළපාළියකින් වර්ණවත් වූ සාංවත්සරික සැමරුම සියළු නිලයින් වෙනුවෙන් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වුණු රාත්‍රී සාදයකින් නිමාවට පත්විණි.



2017.04.01 දින හිටපු සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පි එන්ඩියු පිඑස්සි ජ්‍යේෂ්ඨ නිලධාරී තුමාගේ කඳවුරු සංචාරයේදී අණදෙන නිලධාරී තුමා විසින් සමරු ඵලකයක් පිරිනැමීම



ප්‍රධාන සංඥා නිලධාරී හා බලකාධිපති ලෙස අභිනවයෙන් වැඩ ඇරඹූ මේජර් ජෙනරාල් ඩීඩබ්ඩබ්එම්ඩී විජේසිංහ යූඑස්පි එන්ඩියු පීඑස්සි ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන්ගේ මෙම ඒකක සංචාරය



කිලිනොච්චිය නෙළුම් පියස ශ්‍රවණාගාරයේදී පවත්වනු ලැබූ නව නිපැයුම් තරගාවලියෙහි බල සේනා මූලස්ථාන ඒකක විසින් ඉදිරිපත් කරන ලද අඩු වියදම් මධ්‍යසාර දර්ශකය දෙවන ස්ථානය දිනාගැනීමට හැකි විය.



ඒකකයේ රාජකාරි සිදුකරමින් සිටි ක්‍රියාන්විතයේදී තුවාල ලබා වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ලැබූ සෙ/282001 ලා/කෝ ආර්යරත්න එල්.වයි.පී.ආර්. ආර් එස් පී හට ඒකක සෙනින්ගේ පූර්ණ ශ්‍රම දායකත්වයෙන් ඉදිකරන ලද අංග සම්පූර්ණ නව නිවසක



The SIGNALLER

## 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය පිහිටුවීමෙන් අනතුරුව යුධ හමුදාව තුල වූ ඉලෙක්ට්‍රොනික හා ගුවන් විදුලි/දුරකථන උපකරණ අලුත්වැඩියා කටයුතු ඉටු කිරීම සඳහා සංඥා මූලික වැඩපල ඛණ්ඩය සංඥා බලකායට එක් වූ අතර, එය 1 ශ්‍රීලංසංබ, 2 වන බළඝණය යටතේ එම් ඛණ්ඩය ලෙස ස්ථාපනය කරන ලදි. යුධ හමුදා සංවිධානයෙහි ව්‍යාප්තිය හා සමගාමීව සංඥා බළකායද ව්‍යාප්ත වූ අතර, යුධ හමුදාව වෙත ලබා ගන්නා ලද නව තාක්ෂණික ගුවන් විදුලි උපකරණ, දුරකථන හුවමාරු හා දුරකථන උපකරණ, රේඩියෝ රිලේ උපකරණ හා වෙනත් ඉලෙක්ට්‍රොනික උපකරණ පිළිබඳ අලුත්වැඩියා/නඩත්තු කටයුතු පහසු කරමින් ඛණ්ඩයක් වශයෙන් වූ සංඥා මූලික වැඩපල සංඥා මූලික වැඩපල බළඝණයක් ලෙස ව්‍යාප්ත විය. 1 ශ්‍රීලංසංබ යටතේ සහ පසුකාලීනව සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතේ පහත ඛණ්ඩයන්ගෙන් සමන්විතව නව මුහුණුවරකින් සිය කාර්යයන් ඉටු කරන ලදි.

අ. ගබඩා ඛණ්ඩය

ආ. එම් 1 ඛණ්ඩය සිට එම් 9 ඛණ්ඩය දක්වා

වර්ෂ 1991 අගෝස්තු මස 01 දින සිට වර්ෂ 2000 අගොස්තු 13 දින දක්වා සංඥා මූලික වැඩපල බළඝණය බළඝණ නිළධාරී අණදෙන්නන් 08 දෙනෙකු යටතේ සිය කාර්මික වගකීම් යුධ හමුදාවට ඉටු කල අතර, මෙම වකවානුව තුල ශ්‍රී ලංකාව තුල පැවති බෙදුම්වාදි ත්‍රස්ථවාදි යුද්ධයේදි තාක්ෂණික හා කාර්මික රාජකාරි අවශ්‍යතා නොපිරිහෙලා ඉටු කරන ලදි. වර්ෂ 2000 අගෝස්තු මස 13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නිළධාරී 24 ක් හා සෙසුනිළයන් 513 කින් සමන්විත වූ ව්‍යුහයකින් යුක්තව 28/2001 හා 2001 අගෝස්තු මස 21 දින දරණ හමුදා චරියා නියෝග මගින් සංඥා මූලික වැඩපල ස්වාධීන ඒකකයක් ලෙස සංඥා බලකායට එක්විය. මූලස්ථානය, බළඝණ 05 කින් හා ක්ෂේත්‍ර සංඥා වැඩපල 05 කින් හා මධ්‍යම සංඥා වැඩපලකින් සමන්විත වන අතර එම සංයුතිය ඇතිව 2015.04.24 දින සංඥා මූලික වැඩපල නැවත ප්‍රතිස්ථාපනය වෙමින් 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බලකායේ නව ඒකකයක් වශයෙන් පිහිටුවන ලදි.

10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ දෙවන අණදෙන නිලධාරී වශයෙන් ලූතිතන් කර්නල් ඒපී වික්‍රමසේකර යූඑස්පි පිඑස්සි ජ්‍යේෂ්ඨ නිළධාරී තුමා 2016.09.16 දින දක්වා කටයුතු කිරීමෙන් අණතුරුව 2016.10.10 දින මෙම ඒකක නව අණදෙන නිලධාරී තුමන් ලෙස ලූතිතන් කර්නල් කේවීපි ධම්මික යූඑස්පි ජ්‍යේෂ්ඨ නිලධාරී තුමන් විසින් වැඩ භාර ගන්නා ලදි.

සංඥා බලකාධිපතිතුමාගේ උපදෙස් පරිදි මෙම ඒකකය සඳහා බලඇණි පුහුණුවීම් පාඨමාලාව සංඥා පුහුණු පාසල - මහනුවර පූර්ණ අධීක්ෂණය යටතේ 5(සෙව්) යාපාරෙ මාබේරිතැන්න වෙතින් ඉතා සාර්ථක අයුරින් පවත්වා නිම කරන ලදි. එහිදි මෙතෙක් පවත්වා ඇති බලඇණි පුහුණු පාඨමාලාවන් අතුරින් වැඩි ලකුණු ලබාගෙන බලඇණි පුහුණුවීම් පාඨමාලාවේ ප්‍රථම ස්ථානය ලබා ගැනිමටද හැකිවීම ඉතා විශිෂ්ඨ ජයග්‍රහයක් ලෙස සඳහන් කල හැකිය. තවද බලඇණි පුහුණුවීම් පාඨමාලාවේ විශේෂ අවස්ථාවන් පහත දක්වා ඇත.

යුද්ධය අවසන් වී වසර හතක් ගෙවීමෙන් පසු 69 වන නිදහස් දින උත්සව පෙළපාලිය සඳහා දායකත්වය ලබාදෙන ලදි. මෙම උත්සව වල සියලූම ජන ඇමතුම් රාජකාරි මෙම ඒකකය වෙත පැවරුනු අතර, මෙම ඒකක නිළධාරී හා සෙසුනිළයින් විසින් ඉතාමත් සාර්ථකව එම සේවාවාන් අවසන් කිරීමට හැකිවීම හා මෙම පෙළපාලියේ මෙම ඒකකය විසින් සංවිධානය කරන ලද ගුවන් විදුලි යන්ත්‍ර රැගත් රථ පෙළපාලිය ඉතාමත් උසස් අයුරින් සංවිධානය කර ගැනිමට හැකිවීම හා මෙම ඒකකය විසින් නිදහස් දින පෙලපාලිය සඳහා සංඥා මැදිරි ක්‍රියාකාරිත්වය හා විවිධ රැහන් වර්ගයන් පෙන්නුම් කරමින් නිර්මාණය කරන ලද රථය මෙවරත් නිදහස් දින පෙලපාලිය සඳහා ඉදිරිපත් කිරීම අප ලැබූ තවත් ජයග්‍රහනයක් සේ සැලකිය හැකිය.

10 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකායේ රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් කටයුතු කල ඔනි 1 එන්ජේ සමරවීර යන බලලත් නිලධාරී තනතුරෙන් නික්ම ගිය අතර, නව ඒකක රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් ඔනි 11 කපිල කේඒ යන බලලත් නිලධාරී රෙ:සැ:මේ තුමා තනතුරේ වැඩ භාර ගන්නා ලදී.

තවද 2017 වසරේ වෙසක් උත්සවය නිමිත්තෙන් පැවති බෞද්ධාලෝක මාවතේ පැවති බුද්ධ රශ්මි වෙසක් කලාපය සඳහා සංඥා බලකාය වෙතින් ඉදිරිපත් කරනු ලබන වෙසක් පහන් කුඩුව නිර්මාණය කිරීමේ කටයුතු මෙම ඒකකය වෙත පවරනු ලැබූ අතර,

මෙම ඒකක කාර්මික නිළධාරී/සෙසුනිළයින් විසින් මතින් තොර සමාජයක් පිළිඹිබු වන පරිදි යන්ත්‍රානුසාරයෙන් දර්ශණිය පහන් කුඩුවක් නිර්මාණය කර ප්‍රදර්ශණය කරන ලදි.

මෙම ඒකකයේ කාර්මික නිළධාරී/සෙසුනිලයින් කාර්මික රාජකාරීන්ට අමතරව ගිය වසරේ මෙන්ම මෙම වසරේද අන්තර් සංඥා ඒකක ක්‍රිඩා කටයුතු හා වෙනත් ක්‍රිඩා කටයුතු වෙනුවෙන් සහභාගිවී ජයග්‍රහන ලබා ගන්නා ලදි. එමෙන්ම 2017 වසර සඳහා අන්තර් ඒකක තරග වෙනුවෙන් වුෂු වොලිබෝල් එල්ලේ හා බේස්බෝල් යන ක්‍රිඩා සංවිධානය කර පැවැත්වීමටද මෙම ඒකකය වෙත පැවරුනි. මෙම ක්‍රිඩා තරග සඳහා ක්‍රිඩා කණ්ඩායම් මෙම ඒකකය වෙත ගෙන්වා ඉතාමත් උසස් අන්දමින් අන්තර් ඒකක තරගාවලියන් පැවැත්වීම සඳහා සැලසුම්කර ඇත.

එලඹෙන වසරේදී 10 වන රෙපිමේන්තුව ශ්‍රිලංකා සංඥා බලකායේ නිලධාරීන්ට හා සෙසුනිලයින්ට ගිය වසරේ මෙන්ම සංඥා බලකායට කීර්තියක් ලබාදීමට හැකියාවක් ඇති වන පරිදි ලෝකයේ දියුණු වන තාක්ෂණයට සමගාමීව දේශිය හා විදේශිය පාඨමාලාවන් ලබාදිම තුලින් යුද හමුදාවට අවැසි කාර්මික දැනුම වලදායි ලෙස ලබාදීමේ අදිටනින් එලඹෙන අභියෝග යන්ට සාර්ථකව මුහුණදීමට අප බලාපොරොත්තු වෙමු.



මෙම ඒකකයේ අණදෙන නිලධාරී ලෙස කටයුතු කල ලුතිතන් කර්නල් ඒපි වික්‍රමසේකර යුඑස්පි පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් තනතුර අත් හැරීම වෙනුවෙන් 2016.09.16 වන දින පිරිනමන ලද සම්මාන මුරය හා විශේෂ අවස්ථාවන්.



2016.10.10 වන දින නව අණදෙන නිලධාරී ලෙස ලුතිතන් කර්නල් කේවීපි ධම්මික යුඑස්පි යන ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් වැඩ භාර ගැනීමේ හා සම්මාන මුරයේ විශේෂ අවස්ථාවන්.



බලගැණි පුහුණුවීම් පාඨමාලාවේ විශේෂ අවස්ථාවන්.



මෙම ඒකකය විසින් 68 වන නිදහස් දින පෙලපාලිය සඳහා ප්‍රථම වරට ඉදිරිපත් කරන ලද සංඥා මැදිරි ක්‍රියාකාරීත්වය පෙන්නුම් කරනු ලබන රථයේ විශේෂ අවස්ථා.







රෙපිමේන්තු සැරයන් මේජර් ලෙස කටයුතු කල බනි I එන්ජේ සමරවීර බලලත් නිලධාරී විසින් රෙපිමේන්තු සැරයන් මේජර්වරයාට හිමි යෂ්ටිය අණදෙන නිලධාරී තුමා වෙත භාරදුන් අවස්ථාව.



නව රෙපිමේන්තු සැරයන් මේජර් ලෙස බනි 11 කපිල කේඒ බලලත් නිලධාරී විසින් රෙපිමේන්තු සැරයන් මේජර්වරයාට හිමි යෂ්ටිය අණදෙන නිලධාරී තුමා වෙතින් භාරගත් අවස්ථාව.



02 වන සංවත්සරයට සමගාමීව පවත්වන ලද වොලිබෝල් තරගාවලිය



02 වන සංවත්සරයට සමගාමීව පවත්වන ලද අවිස්සාවේල්ල මන්ද මානසික ළමා නිවාසය වෙත දානය දුන් අවස්ථාවන්



10 වන රෙපිමේන්තුව ශ්‍රිලංකා සංඥා බලකාය (සන්නිවේදන තාක්ෂණ) ඒකකයේ 2 වන සංවත්සරයට සමගාමීව අණදෙන නිලධාරී තුමන් වෙත පිරිනමත ලද සම්මාන මුරය හා සම්මාන පෙළපාලියේ විශේෂ අවස්ථා



නව සංඥා බලකාධිපති වශයෙන් වැඩ භාර ගන්නා ලද මේජර් ජෙනරාල් ඩීඑච්එම්ඒ විජේසිංහ යුඑස්පි එන්ඩියු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමා විසින් 2017.05.09 වන දින මෙම ඒකකයේ සිදුකරනු ලැබූ සංචාරයේ විශේෂ අවස්ථාවන්



2016 ඔක්තෝම්බර් 17 වන දින නව අණදෙන නිළධාරී ලෙස ලුතිතන් කර්නල් එම්ටීසි ද සිල්වා ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමා වැඩ භාරගන්නා ලද අවස්ථාව.



2017 මැයි මස 17 දින දෙවන අණදෙන නිළධාරී වශයෙන් මේජර් එස්ඒඑල්අයි ජයසේන යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමා වැඩ භාරගන්නා ලදී.



2017 වර්ෂයට යෙදුනු 07 වන සංවත්සරයට සමගාමීව 2017.09.21 දින අණදෙන නිලධාරීතුමන් හට සම්මාන පෙලපාලිය ලබා දීමේ අවස්ථාව.



2017 අගෝස්තු මස 21 දින නව රෙපිමේන්තු සැරයන් මේජර් වශයෙන් බනි II විජේසේකර එන්පී විසින් වැඩ භාරගන්නා ලදී.



2017 මාර්තු මස 02 සහ 03 යන දිනයනහිදී පැවැත්වූ අන්තර් සංඥා ඒකක වෙස් තරඟාවලියෙන් ප්‍රථම ස්ථානය හිමි කරගත් 11 ශ්‍රීලංසංබ කණ්ඩායම.



2017 මැයි මස 10 වන දින වෙසක් පුන් පොහෝ දිනයට සමගාමීව යුහ බෝධිරාජාරාමය අසළ පැවැත්වූ සව්කැඳ දන්සල.



The SIGNALLER

## 12 වන රෙපිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

ශ්‍රී ලංකා යුද හමුදා මැණියන්ගේ, අභිමානවත් විරෝදාර පුතණුවන් අතර සන්නිවේදනයේ ප්‍රමුඛයා වන සංඥා බලකාය, ප්‍රෞඪ ඉතිහාසයක් අතැතිව දේශය වෙනුවෙන් තම සීමා විරහිත සේවය මවුබිමට එක්කිරීම සඳහා යුද හමුදාවට එක්වන්නේ මීට වසර 73 කට පෙරය. සුපැහැදිලි ගමන් මගක ඉදිරියට පියමන් කරන මෙම බලකායට නවතමයෙන් එක්වූ සයිබර් ආරක්ෂණ ඒකකය, අනාගත අභියෝගයන් සඳහා මෙම බලකයේ පෙර සූදානම මනාවට කියාපාන්නකි.

හිටපු බලකාධිපතිතුමන් වන මේජර් ජෙනරල් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යුඑස්පී එන්ඩියු පීඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්ගේ සංකල්පයකට අනුව අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණයේ මග පෙන්වීම යටතේ ගොඩනැංවුනු මෙම ඒකකය ශ්‍රී ලංකා යුද. හමුදාවේ කර්නල් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීයෙකු විසින් අණදෙනු ලබන ප්‍රථම රෙපිමේන්තුව ලෙස ඉතිහාසයට එක්වේ.

නූතන සයිබර් අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමේ පරමාර්ථය පෙරදැරිව යුද හමුදා ජනපදයේදී යුද හමුදා චර්යා නියෝග ARO 24/2015 අනුව ඇරඹි මෙම ඒකකයේ කෙටිනාමකරනය වනුයේ 12 ශ්‍රීලංසංබ (ස/ආ)ය.

12 වන සංඥා රෙපිමේන්තුවේ ප්‍රථම අණදෙන නිලධාරිතුමන් වනුයේ කර්නල් එස්පිපි පක්ෂවීර ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමන්ය. එමෙන්ම ආරම්භක දෙවන අණදෙන නිලධාරී ලෙස කටයුතු කරන ලද්දේ මේජර් අයිපීකේ දියංකරගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්ය. මීට අමතරව නිලධාරී අණදෙන ලෙස මේජර් ටීඩීටී විජේසිංහ, මේජර් සීකේබී අංගම්මන, කාර්මික විධායක අධිකාරී ලෙස කපිතාන් සීඑස්කේ පතිරණ, උපකරණ පාලක නිලධාරී ලෙස කපිතාන් එච්ඒඩීපී හෙට්ටිආරච්චි යූඑස්පී, කපිතාන් පීඒ අමිල හා ලුතිතන් එච්සි මධුරංග යන නිලධාරීන් රාජකාරී කරනු ලැබූ අතර මොවුන් මෙම ඒකකයේ ආරම්භක නිලධාරී මඬුල්ල ලෙස ඉතිහාසයට එක්වේ. මීට අමතරව වර්ථමානයෙ දෙවන අණදෙන නිලධාරී ලෙස මේජර් පීඒආර් ඇන්තනිස් පීඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් හා නව උපකරණ පාලක නිලධාරී ලෙස උපපනි (උපා) එන්ඩබ්ලිව් රත්නායක යන නිලධාරීන්ද මෙම ඒකකය වෙනුවෙන් අනුපමේය සේවයක් ඉටුකරනු ලබයි.

ඒකකයේ ප්‍රථම රෙපිමේන්තු සැරයන් මේජර් ලෙස බනි 11 ජයවර්ධන එස්ජේයූඑස්පී 5 ශ්‍රීලංසංබ බළලත් නිලධාරී තුමා කටයුතු කල අතර වර්තමානය වනවිට බනි 11 විජේසූරිය බීපී 6 ශ්‍රීලංසංබ බළලත් නිලධාරී තුමා කටයුතු කරයි. ප්‍රථම ප්‍රධාන ලිපිකරු ලෙස බනි 11 කුමාරසිංහ කේඑම්පී 9 ශ්‍රීලංසංබ බළලත් නිලධාරී තුමා සේවයෙහි නියලුණු අතර මේ වනවිට මෙතුමන් විශ්‍රාමගොස් ඇත.

නිලධාරීන් 08 ක් සහ සෙසුනිලයින් 41 දෙනෙකුගෙන් සමන්විත මෙම ඒකකයේ, මේජර් ටීඩීටී විජේසිංහ නිලධාරීතුමන් විසින් මූලස්ථාන බලඝණයටද, මේජර් සීකේබී අංගම්මන නිලධාරීතුමන් විසින් සයිබර් ආරක්‍ෂණ බලඝණයටද, කපිතන් සීඑස්කේ පතිරණ නිලධාරීතුමන් විසින් සයිබර් විගණන බලඝණයටද, කපිතන් පීඒ අමිල නිලධාරීතුමන් විසින් සයිබර්" ප්‍රහාරක බලඝණයටද අණදෙනු ලබයි.

මෙම ඒකකයේ ආරම්භයේ සිට මේ දක්වා සිදුකරන ලද සුවිශේෂ කර්තව්‍යයන් අතර ඒකකයේ සියලුම නිලධාරීන් සහ සියලුම සෙසුනිලයින් ඒකකයේ ධජයට සෙත්පැතිම සදහා කතරගම පුදභූමිය බලා ගමන් කිරීම, අන්තර් ඒකක සරඹ තරගාවලිය සදහා සහභාගිවීම හා අන්තර් ඒකක වෙස් තරගාවලිය සංවිධානය කිරීමද මෙම ඒකකය මගින් කරන ලද සුවිශේෂ කර්තව්‍යයන් වේ.

හිටපු බලකාධිපතිතුමන් වන මේජර් ජෙනරල් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යුඑස්පී එන්ඩියු පීඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමාගේ ඒකක සංචාරය සහ වත්මන් බලකාධිපතිතුමා වන මේජර් ජෙනරල් බීඑච්එම්ඒ විජේසිංහ යුඑස්පී එන්ඩියු පීඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමාගේ ඒකක සංචාරය ඒකක ඉතිහාසයේ ඉතාමත් වැදගත් සන්ධිස්ථානයකි.

තවද, මෙවන්වූ මෙහෙවරක් ඉටුකරනු ලබන 12 වන රෙපිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ නාමය සංඥා බලකාය තුළ පමණක් නොව සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ දීප්තිමත් ඒකකයක් ලෙස වැජඹෙන්නට ප්‍රාර්ථනා එක් කරමින් පසුගිය වසරෙහි අතිතාවර්ජනය මෙසේ සමාප්ත කරන්නෙමු.



ප්‍රථම අණදෙන නිළධාරී කර්නල් එස්පීපී පක්ෂවීර ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් වෙත 2017.01.25 වන දින පිරිනැමු සම්මාන පෙළපාලිය.



නව රෙපිමේන්තු සැරයන් මේජර් ලෙස සෙ/277918 බනි 11 විජේසූරිය බීපී බලලත් නිලධාරී හට රෙපිමේන්තු සැරයන් මේජර් වරයාට හිමි යෂ්ඨිය අණදෙන නිලධාරී තුමා විසින් 2017.06.05 වන දින පිරිනැමූ අවස්ථාව.




අණදෙන නිලධාරීතුමන් හා සෙසුනිලයන් සමූහ ඡායාරූපයකට පෙනීසටි අවස්ථාව.



2017.01.28 දින ඒකකයේ අණදෙන නිලධාරීතුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයන්ගේ සහභාගීත්වයෙන් ගහාරගම අෂ්ඨඵල බෝධීන් වහන්සේ අභියසදී ඒකක ධජයට හෙත්පැලීම.



හිටපු බලකාධිපතිතුමන් වන මේජර් ජෙනරල් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යුඑස්පී එන්ඩියු පීඑස්සී පීපීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාර් තුමා විසින් සිදු කල ඒකක සංචාරය.







වත්මන් බලකාධිපතිතුමා වන මේජර් ජෙනරල් බීඑච්එම්ජ් විජේසිංහ යුඑස්පී එන්ඩියූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමා විසින් 2017.05.08 දින සිදු කල ඒකක සංචාරය.



නව දෙවන අණදෙන නිලධාරී වශයෙන් මේජර් පීඒආර් ඇන්තනීස් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් 2017.07.05 දින සුභ මොහෙතින් රාජකාරි භාරගත් මොහොත .



2017.02.12 වන දින රෙපිමේන්තු මධ්‍යස්ථාන මගින් පවත්වන ලද අන්තර් ඒකක සරඹ තරගාවලිය සඳහා සහභාගී වීම.



2017.07.17 වන දින ආරක්ෂක සේනා මූලස්ථානයේ පැවති නව නිපැයුම් තරගාවලියේ ප්‍රථම ස්ථානය 12 ශ්‍රීලංසංබ හි කපිතාන් පී.ඒ පෙරේරා විසින් හිමි කරගන්නා ලදී.



අන්තර් ඒකක චෙස් ක්‍රීඩා තරගාවලිය 2017.03.03 වන දින 12 [illegible] ඒකකයේ මූලිකත්වයෙන් පැවැත්වීම.



2017.04.08 වන දින රෙපිමේන්තු මධ්‍යස්ථාන මගින් සංවිධානය කරන ලද සිංහල අලුත් අවුරුදු උත්සවයේ තරග සංවිධානය සඳහා සහයෝගය දැක්වීම.





2017.04.28 දින නව බලකාධිපති මේජර් ජෙනරල් ඩීඑච්එම්ඒ විජේසිංහ යුඑස්පී එන්ඩියු පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් සංඥා පාසලේ සංචාරය සිදු කිරීම හා සම්මාන මුරයක් ලබා දුන් අවස්ථාව

නව මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් පත්වූ බ්‍රිගේඩියර් පීඒජේ පීරිස් ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් 2017.08.03 දින සංඥා පුහුණු පාසල සංචාරයේදී සංඥා කෞතුකාගාරය නැරඹූ අවස්ථාව



2017.08.01 දින ලංකා බැංකුව, මහනුවර අනුග්‍රහය යටතේ ලේ දන්දීමේ වැඩසටහනක් සිදුකල අතර, ඒ සඳහා සෙබලුන් හා පාඨමාලා ශිෂ්‍යයන් තම දායකත්වය ලබා දුන් අවස්ථාව



පරිගණක විද්‍යාගාරයේ පාඨමාලාවන් පැවැත්වෙන අවස්ථාවක්



ඩෙංගු මර්ධන වැඩසටහනක් සඳහා සෙබලුන් දායකත්වය දැක්වූ අවස්ථාවක්



ගංවතුර තත්වය හේතුවෙන් පීඩාවට පත්වූ මෙම පුහුණු පාසලේ රාජකාරී කරනු ලබන අයවලුන් හට සංඥා පුහුණු පාසල සියලු නිලයින් විසින් ලබාදුන් ආධාර ලබා දුන් අවස්ථාව





## 2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය (ස්වේච්ඡා)

2017 වර්ෂය ආරම්භවීමත් සමගම ගතවී ඇති කාලසීමාව දෙස හැරී බැලීමේදී සංඥා බලකා මාතාවගේ එකම ස්වේච්ඡා සාමාජිකයා වන මෙම ඒකකය සංඥා බලකායේ විශිෂ්ඨ ඒකකය ලෙස රැගෙන යාමේ මහගු අභියෝගයට මුහුණ දීමට හැකිවන පරිදි 2017 වර්ෂයට අදාලව පැවති අන්තර් ඒකක සරඹ තරගාවලිය සඳහා මෙම ඒකකය වෙතින් සහභාගි වු සරඹ කණ්ඩායම හොඳම සරඹ කණ්ඩය/සරඹ තරගාවලියේ අණදීමේ දක්ෂතම නිළධාරි සහ දක්ෂතම සරඹ උපදේශක යන ස්ථානයන් තුනම අනෙකුත් සියලුම සංඥා ඒකක අභිබවා ප්‍රථම ස්ථානය දිනාගැනිම ඒකකය ලද විශේෂ ජයග්‍රහණයක් ලෙස පෙන්වා දිය හැකිය. තවද ඒකක හට පිරිස් තවත් ධෛර්යමත් කරමින් වත්මන් ඒකක අණදීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2017 වර්ෂයේ පළමු අඩවසරේ වොලිබෝල්, කඹ ඇදිම, එල්ලේ යන ක්‍රිඩාවන්ගෙන් ඒකකය ලත් ජයග්‍රහණයන්ද අප ඒකකය ලද ජයග්‍රහණයන් ලෙස පෙන්වාදිය හැකිය.

ආසේමු(නැගෙනහිර) වෙතින් සංවිධානය කරන ලද වෙසක් උත්සවයට සමගාමීව පොලොන්නරුව නගරයේ පැවති වෙසක් කළාපය සඳහා මෙම ඒකකය වෙතින්ද පහන් කුඩුවක් ඉදිරිපත් කල අතර, ඉදිරිපත් කරන ලද වෙසක් කුඩු අතරින් තෝරා ගන්නා ලද කුඩු "පුලතිසි" පොසොන් උද්‍යානය - 2017 ප්‍රදර්ශණය කිරිම සඳහා පොලොන්නරුව තෝපාවැව විද්‍යාලය වෙන්දේසි වත්තෙහි මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන ලදි. තවද ආසේමු(නැ) බලප්‍රදේශය තුල පැවති ක්‍රිකට් තරගාවලියේදී මෙම ඒකකය අනුශූරතාවය දිනා ගන්නා අතර, එම කණ්ඩායමට සහභාගිවු ක්‍රිඩකයින් අතරින් දක්ෂතා දක්වන ලද සෙනින් ආසේමු(නැගෙනහිර) ක්‍රිකට් කණ්ඩායම සඳහා තෝරා ගැනිම තුලින් ක්‍රිඩකයින් දක්වන ලද දක්ෂතාවයන් ආරක්ෂක සේනා මුලස්ථානයේ පැසසුමට ලක්ව ඇත.

